# ජාතික ප්‍රතිපත්ති රාමුව

## රට හදන සෞභාග්‍යයේ දැක්ම

සාරාංශය

## පටුන


1. දස වැදැරුම් ප්‍රතිපත්තිය ..... 3
2. දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් ..... 5
3. සුරක්ෂිත රටක් ..... 9
4. ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් ..... 15
5. ජනතා කේන්ද්‍රීය ආර්ථිකය ..... 27
6. තාක්ෂණය මත පදනම්වන සමාජයක් ..... 43
7. භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය ..... 45
8. තිරසාර පාරිසරික ප්‍රතිපත්තියක් ..... 55
9. ගුණගරුක විනයගරුක නීතිගරුක සමාජයක් ..... 61
10. ගම සමඟ පිළිසඳර ..... 71

# 1 පරිච්ඡේද

## දස වැදැරුම් ප්‍රතිපත්තිය

### හැඳින්වීම

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව දස ප්‍රතිපදාවන්ගෙන් යුක්ත වන අතර; ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණකරුක විනයගරුක සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විධ අරමුණු; ළඟාකර ගැනීම අපේක්ෂා කරයි. ආර්ථික හා සමාජීය, පාරිසරික හා දේශපාලනික අංශ කෙරෙහි අවධානයක් යොමු වී ඇති මෙම දස ප්‍රතිපදාවන් පහත දැක්වේ.

දස ප්‍රතිපදා

1. ජාතික ආරක්ෂාවට මුල්තැන.
2. මිත්‍රශීලී හා නොබැඳුනු විදේශ ප්‍රතිපත්ති
3. පිරිසිදු රාජ්‍ය පාලනය
4. ජනතාවට වගකියන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයක්
5. ඵලදායී පුරවැසියෙක් - සශ්‍රීක මානව සම්පතක්
6. ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්
7. තාක්ෂණය මත පදනම් වන සමාජයක්
8. භෞතික සම්පත් සංවර්ධනය
9. තිරසාර පරිසර කළමණාකරණය
10. විනයගරුක, නීතිගරුක සහ ගුණගරුක සමාජයක්

ජාතික ප්‍රතිපත්ති රාමුව රාජ්‍ය ආරක්ෂාව කෙරෙහි ඉහලම ප්‍රමුඛත්වය ලබා දී ඇත. එමෙන්ම රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී මහජන අවකාශයන් අහුරාලීමෙන් තොරව නවීන ක්‍රමෝපායන් තුළින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරනු පිණිස කටයුතු කරයි.

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **යහපාලන** | මහජන හිතවාදී රජයක් ඇති කිරීම. | කාර්යක්ෂම යහපාලන යාන්ත්‍රණයක් | කැබිනට් අමාත්‍යවරුන් ලෙස විෂය පිළිබඳ විශේෂඥතාව සහ පළපුරුද්දක් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කිරීම. |
| | | අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස පරිණත හා කැපවීමෙන් කටයුතු කරන රාජ්‍ය නිලධාරීන් පත්කිරීම | • අදාල විෂය ක්ෂේත්‍රයේ නිපුන හෝ පරිපාලන දක්ෂතා ඇති පළපුරුදු සහ නවෝත්පාදන හැකියාවෙන් යුත් රාජ්‍ය නිලධාරීන් අමාත්‍යාංශ ලේකම්වරු ලෙස පත් කරනු ලැබේ.<br>• ශක්තිමත් රාජ්‍ය පරිපාලන කාර්ය මණ්ඩලයක් බිහි කිරීම සඳහා අදාළ පුහුණු හා නිපුණතා සංවර්ධනය කිරීම<br>• සියළුම විධායක හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් හඳුන්වා දීම සහ ඔවුන්ගේ හැකියා වර්ධනය සඳහා දැනුම හා නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් (දේශීය / විදේශීය) සංවිධානය<br>• කුසලතා සහ නායකත්ව හැකියාවන් මත පදනම්ව රාජ්‍ය ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් තෝරා ගැනීම සඳහා නව යාන්ත්‍රණයක් හඳුන්වා දීම |
| | | සියලුම පරිබාහිර නීති සමාලෝචනය කිරීම | රාජ්‍ය සේවාව කඩිනම් කිරීම සඳහා රාජ්‍ය අංශයේ පවත්නා රීති හා රෙගුලාසි යාවත්කාලීන කිරීම |
| | | ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේදී විනිවිදභාවය සහතික කිරීම | • ජාතික ආර්ථික කවුන්සිලය සහ උපායමාර්ගික ව්‍යවසාය කළමනාකරණ ඒජන්සිය වෙනුවට ජනාධිපතිවරයා යටතේ 'ජාතික ප්‍රතිපත්ති, සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ කොමිෂන් සභාව' පිහිටුවීම<br>• ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම |
| | | 2030 වන විට තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම | 2030 වන විට තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැබිනට් අමාත්‍යවරුන් ප්‍රතිව්‍යුහගත කිරීම |
| | | රාජ්‍ය වියදම් කාර්යක්ෂම හා ඵලදායි අයුරින් යොදා ගන්නා බවට සහතික කිරීම. | කැබිනට් මණ්ඩලයේ ලේකම්ගේ සභාපතිත්වය යටතේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කණ්ඩායමක්, රජයේ වියදම් සහ ආයෝජන පිළිබඳ කැබිනට් පත්‍රිකා නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපනය රාජ්‍ය අංශවල කාර්යාල සඳහා වාහන මිලදී ගැනීම සහ කුලියට ගැනීම වසර 3 කට අත්හිටුවීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | |
| | දූෂණය පිටුදැකීම | දේශපාලනඥයන් සහ රජයේ ඉහළ නිලධාරීන් කිසිදු ආකාරයකින් දූෂණයන් සඳහා සම්බන්ධ නොවන බවට සහතික කිරීම | • ශ්‍රී ලංකා මහ බැංකු වංචාව සහ ප්‍රධාන මූල්‍යමය අපාරධ 20ක් නීතිය ඉදිරියට ගෙන ඒම<br>• දූෂිත දේශපාලනඥයින්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව ඇති අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම බලගැන්වෙන පනතක් මගින් අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසම ශක්තිමත් කිරීම<br>• මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය විධිමත් කිරීම සහ ආයතනිකකරණය කිරීම සහ මහජනතාවගේ පැමිණිලි ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම<br>• මූල්‍ය අපරාධ විභාග කිරීම සඳහා මූල්‍ය අපරාධ විමර්ෂණ ඒකක හෝ විශේෂ අධිකරණයක් පිහිටුවීම |
| | | දූෂණය තුරන් කිරීම සඳහා නවතාක්ෂණය සහ නීති ප්‍රතිසංස්කරණ උපයෝගී කර ගැනීම | • අල්ලස් හා දූෂණය අවම කිරීම සඳහා ප්‍රසම්පාදනය, බදු නිර්ණය සහ කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා පරිගණක ආශ්‍රිතව කටයුතු කළ හැකි මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දීම<br>• මාර්ගගත ජාතික ප්‍රසම්පාදන ක්‍රියාවලිය හඳුන්වා දීම<br>• මහජනතාවගේ වත්කම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට සහ මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට නව රාජ්‍ය යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම<br>• මහජන පැමිණිලි ලබා ගැනීම සඳහා විද්‍යුත් තාක්‍ෂණ පද්ධතියක් හඳුන්වාදීම සම්බන්ධයෙන් පවතින නීතිය ප්‍රතිසංස්කරණය කිරීම<br>• රාජ්‍ය හා පෞද්ගලික අංශ තුළ සිදුවන දූෂණ හා අපතේ යන වියදම් පියවා ගැනීම සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කොමිසමේ නීතිමය කටයුතු ශක්තිමත් කිරීම. |
| | රාජ්‍ය ව්‍යවසාය කළමණාකරණය | සියලුම රාජ්‍ය ව්‍යවසායන්ගේ සභාපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලවල වගවීම පිළිබඳ සහතික වීම | • සියලු රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික සැලැසුම් සකස්කිරීම සඳහා ඒකරාශි වීම, ඒවා වාර්ෂිකව සමාලෝචනය කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම.<br>• තම ආයතනවල සිදුවන සෑම ආකාරයකම අක්‍රමිකතා සම්බන්ධයෙන් සියලුම රාජ්‍ය ව්‍යවසායන්හි සභාපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගවීම සහතික කිරීම<br>• විගණන ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශය නියමිත වේලාවට ඉදිරිපත් කරන ලෙස සියලුම රාජ්‍ය බැංකු, රාජ්‍ය ව්‍යවසායන් සහ රාජ්‍ය සංස්ථාවන්ට නියම කිරීම |
| | | රජයට අයත් ව්‍යවසායන් | • ඕනෑම පොදු ව්‍යාපාරයක් පුද්ගලීකරණය කිරීම වැළැක්වීම සඳහා නීති පැනවීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | පුද්ගලීකරනය නැවැත්වීම සඳහා නීති ප්‍රතිසංස්කරණ | • රජය සතු ආයතන ආරක්ෂා කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීති හඳුන්වා දීම. |
| | | රාජ්‍ය ව්‍යවසායන් සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණ | • රාජ්‍ය ව්‍යවසායන් කළමනාකරණය කිරීම සඳහා වෘත්තීය මට්ටමින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත් කිරීම<br>• ජාතික ව්‍යවසාය අධිකාරිය පිහිටුවීම<br>• සමාන ආකාරයේ ක්‍රියාකාරී රාජ්‍ය ව්‍යවසායන් ඒකාබද්ධ කිරීම.<br>• රාජ්‍යය මූල්‍ය වශයෙන් වැදගත් රාජ්‍ය ව්‍යවසායන් සඳහා විශේෂ භාණ්ඩාගාර මූල්‍ය අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>• මහා පරිමාණ රාජ්‍ය ව්‍යවසාය සඳහා දක්ෂ හා පළපුරුදු වෘත්තිකයින් බඳවා ගැනීම සහ පවත්නා වැටුප් හා පාලන නීති සංශෝධනය කිරීම.<br>• රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම. |
| | ප්‍රජාතන්ත්‍රවාදී පාලනය හරහා ජාතික සමගිය ළඟා කර ගැනීම | මහජන අභිලාෂය මත පදනම් වූ නව ව්‍යවස්ථාව. | • විධායක ජනාධිපති ධුරය, මිශ්‍ර මැතිවරණ ක්‍රමය, පළාත් සභාව සමාලෝචනය කිරීම සහ අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම.<br>• බුද්ධාගමට ප්‍රමුඛ ස්ථානය සහතික කිරීම, ආගමික නිදහස ස්ථාපිත කිරීම සහ මූලික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම. |
| | | ජනවාර්ගික කණ්ඩායම් අතර සංහිඳියාව | • ජනාධිපතිවරයාගේ සභාපතිත්වය යටතේ අන්තර් ආගමික උපදේශක සභාව පිහිටුවීම.<br>• එල්ටීටීඊ සාමාජිකයින් පුනරුත්ථාපනය කිරීම සහ විවිධ වැරදි සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පුද්ගලයින් සමාජානුගත කිරීම.<br>• ත්‍රස්තවාදය හා සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් චෝදනා ලැබූ සියලු දෙනාට මාස තුනක කාලයක් තුළ අධිචෝදනා ගොනු කිරීමට හෝ මාස 3 ක් ඇතුළත නිදහස් කිරීමට පියවර ගැනීම.<br>• ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක, ස්වාභාවික සම්පත්, නාගරීකරණය සහ අනාගත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටුවීම.<br>• සිංහල සිසුන්ට දෙමළ හා දෙමළ මාධ්‍ය සිසුන්ට සිංහල ඉගෙනීම අනිවාර්ය කිරීම මගින් සන්නිවේදන පරතරය අඩු කිරීම. |
| | | හොඳින් විනයගරුක | • නොහික්මුණු, නීති විරෝධී සහ අයහපත් මහජන නියෝජිතයන් සම්බන්ධයෙන් නීතියට |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | දේශපාලන පරිසරයක් | අනුකූලව කටයුතු කිරීම.<br>• මැතිවරණ ආශ්‍රිත වියදම් පාලනය සඳහා නීති පැනවීම.<br>• මැතිවරණ නීතී උල්ලංගනයවීම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මැතිවරණ කොමිසමට බලය ලබා දීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | ජාතික ආරක්ෂාව සඳහා ඉහළ ප්‍රමුඛතාවය | ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ බුද්ධි අංශ සේවා ශක්තිමත් කිරීම | • දක්ෂ නිලධාරීන් බඳවා ගැනීම<br>• අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට අවශ්‍ය බලතල සහිතව බුද්ධි අංශ ප්‍රධානි තනතුරක් ස්ථාපිත කිරීම |
| | | විදේශ බුද්ධි සේවා සමඟ මනා සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම | • නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ බුද්ධි අංශ නිලධාරීන්ට දේශීය හා විදේශීය පුහුණුව ලබා දීම |
| | | ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ චිත්ත ධෛර්ය යළි ගොඩ නැඟීම | • කිසිදු දේශපාලනික බලපෑමකින් තොරව ත්‍රිවිධ හමුදා නිලධාරීන්ට නොබියව සහ අභිමානයෙන් යුතුව රාජකාරි ඉටු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය නීතිමය ආරක්ෂාව තහවුරු කිරීම |
| | | රාජ්‍ය තාන්ත්‍රික ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව හා සයිබර් ආරක්ෂාව සහතික කිරීම | • අපරාධ, මත්ද්‍රව්‍ය, මුදල් විශුද්ධිකරණය සහ දූෂණයෙන් රට මුදවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම<br>• රටේ සියලු පුරවැසියන්ට විශේෂයෙන් කාන්තාවන්ට සහ ළමයින්ට නිදහසේ ජීවත් වීමට අවශ්‍ය රැකවරණය ලබා දීම |
| | | ආයෝජකයන් සඳහා නිදහස් පරිසරයක් ඇති කිරීම | • සියලුම වර්ගයේ අල්ලස්, කප්පම්, දූෂණ සහ තර්ජන වලින් ආරක්ෂා කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | ත්‍රස්තවාදයට හා අන්තවාදයට සහාය දක්වන සියලුම තත්වයන් අහුරාලීම | • අප්‍රේල් 21 ප්‍රහාරය සම්බන්ධව විමර්ශනය කිරීම සඳහා ස්වාධීන කොමිසමක් පත්කිරීම , නීති උල්ලංඝනය කර ඇති සියලු දෙනා රටට හෙළි දරව් කිරීම හා වැරදිකරුවන් සඳහා දඩුවම් කිරීම<br>• එම ප්‍රහාරයෙන් තුවාල ලැබූවන් සඳහා රාජ්‍ය අනුග්‍රහයෙන් දේශීය ප්‍රතිකාර වලට අමතරව අවශ්‍ය විටෙක විදේශ ප්‍රතිකාර ලබා දීම<br>• සදාකාලික ආබාධයන්ට ලක්වූවන් සඳහා දීර්ඝකාලීන රැක බලා ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම<br>• එම ප්‍රහාරයෙන් දෙමව්පියන් අහිමි වූ දරුවන් රැක බලා ගැනීමට ඉදිරිපත් වී සිටින ඔවුන්ගේ ඥාතීන්ට මාසික දීමනාවක් ලබා දීම<br>• එම ප්‍රහාරයට ලක් වූ පවුල් සඳහා මෙතෙක් ගෙවා නොමැති වන්දි නොපමාව ලබා දීම |
| | මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් | රටතුළට මත්ද්‍රව්‍ය ඇතුළුවීම වැළැක්වීම | • රේගු දෙපාර්තමේන්තුවට සහ අනෙකුත් අදාළ ආයතන වලට නවීන තාක්ෂණික උපකරණ ලබා දීම<br>• මත්ද්‍රව්‍ය හුවමාරුව වැළැක්වීම සඳහා පොලීසිය සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් බල ගැන්වීම<br>• රටතුළින් මත්ද්‍රව්‍ය තුරන් කිරීම සඳහා මහජන සහභාගිත්වය ලබා ගැනීම |
| | | මත් උවදුරෙන් පාසල් දරුවන් මුදවා ගැනීම | • මත්ද්‍රව්‍ය සඳහා ගොදුරු වූ දරුවන් පුනරුත්ථාපනය සඳහා වැඩ සටහනක් දියත් කිරීම<br>• මත්ද්‍රව්‍ය භාවිතයට පහසුවෙන් ගොදුරු විය හැකි ස්ථාන අධීක්ෂණය සඳහා පරීක්ෂණ ක්‍රමවේදයක් දියත් කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
| --- | --- | --- | --- |
| | ආරක්ෂක සේවා - සේවයට ආරක්ෂාව | මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සහතික කිරීම | • මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන් ඉන් මුදවා ගැනීමට අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබා දීම<br>• නවීන ප්‍රතිකාර පහසුකම් සහිත  පුනරුත්ථාපන ආයතන 04 ක් දිවයින පුරා ස්ථාපිත කිරීම |
| | | ආරක්ෂක හමුදා , පොලිස් නිලධාරීන්ගේ සහ සිවිල් ආරක්ෂක බලකායේ  ගෞරවය යළි ස්ථාපිත කිරීම | • අභූත චෝදනාවන්ට ලක්ව බන්ධනාගාර ගතව සිටින නිලධාරීන් වහාම නිදහස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම<br>• වැටුප් සහ දීමනා සහ උසස්වීම් ගැටලු විසදීම<br>• බැරැක්ක සහ නේවාසික පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම<br>• විශ්‍රාමිකයින්ගේ සහ සියලු ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ වෛද්‍ය පහසුකම් වැඩි කිරීමට පියවර ගැනීම<br>• එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවල සේවය කිරීමට අවස්ථා වැඩි කිරීම<br>• සේවයේ නියුතු , ආබාධිත රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ පවුල් සඳහා සහන ණය පහසුකම් සැපයීම<br>• දැනට පවතින ණය යෝජනා ක්‍රමයන් හි ප්‍රමාදයන් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම<br>• කප්පාදු කර ඇති විදේශ පුහුණු වීම් නැවත ලබා දීම |
| | තෘප්තිමත් පොලිස් සේවයක් | සියලුම පොලිස් නිලධාරීන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම | • පොලිස් විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | කාර්යක්ෂම පොලිස් සේවයක් ස්ථාපිත කිරීම | • පොලිස් ස්ථාන සඳහා ස්ථානාධිපති වරුන් පත් කිරීමේ දී විනිවිද භාවයෙන් යුත් ක්‍රමවේදයක් සකස් කිරීම<br>• කාර්යසාධන සහ ජ්‍යෙෂ්ඨත්වය මත පදනම් වූ උසස් වීම් ක්‍රමවේදයක් සකස් කිරීම<br>• රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලුම පහසුකම් ලබා දීම |
| | | සුබසාධන පහසුකම් වැඩිදියුණු කිරීම සහතික කිරීම | • පැය 08 කට වඩා වැඩි කාලයක් සේවයේ යෙදවීමෙන් සිදු වන දුෂ්කරතා මඟ හරවා ගැනීමට අදාළ බඳවා ගැනීම් සිදු කිරීම<br>• හැකිතාක් දුරට නිලධාරීන් සඳහා තම නිවසේ සිට රාජකාරියට පැමිණීමට හැකිවන පරිදි සේවා ස්ථානවලට අනුයුක්ත කිරීම හා නේවාසික පහසුකම් වැඩි දියුණු කිරීම<br>• ත්‍රිවිධ හමුදාවන්ට ලබාදෙන ආකාරයේ ආහාර දීමනා ඇතුළු සියලු දීමනාවන් ඉහළ දැමීම<br>• රාජකාරි හා පෞද්ගලික භාවිතය සඳහා පොලිස් පරීක්ෂක තනතුරෙන් පහල නිලධාරීන්ට යතුරුපැදි ලබාදීම.<br>• දැනට පවතින සුභසාධන පහසුකම් කාලීන අවශ්‍යතා අනුව සැකසීම.<br>• පොලිස් ක්‍රීඩා සමාජ හා තූර්ය වාදන කණ්ඩායම් සඳහා පහසුකම සැපයීම. |
| | සිවිල් ආරක්ෂක බලකාය | | • අත්‍යාවශ්‍ය හේතුවකදී හැර පදිංචි දිස්ත්‍රික්කයෙන් පිටත දිගුකාලීන ස්ථාන මාරුවීම් නොකිරීම. |
| | රණවිරුවන්ගේ සේවය ඇගයීම | රණවිරුවන්ගේ සුභසාධනය තහවුරු කිරීම. | • ආබාධිත රණවිරුවන්ගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීම.<br>• ආබාධිත රණවිරුවන් හට ජීවිතාන්තය දක්වා හා ඔහුගේ අභාවයෙන් පසු යැපෙන්නන් හට විශ්‍රාම වැටුප් හිමිකම තහවුරු කිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | • ආබාධිත රණවිරුවන්ගේ විශ්‍රාම වැටුපෙන් කරනු ලබන අසාධාරණ මුදල් කපා හැරීම් අත්හිටුවීම<br>• අභිමන්සල වැනි පුනරුත්ථාපන මධ්‍යස්ථාන නැවත සංවර්ධනය කිරීම.<br>• අත්පා අහිමිවූ රණවිරුවන්ට කෘත්‍රිම අත්පා ලබා දීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රමවේදයක් ඇති කිරීම. |
| | මිත්‍රශීලී හා නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් | උපායමාර්ගික හා ආර්ථිකමය වශයෙන් වැදගත් භෞතික සම්පත්වල දේශිය හිමිකාරත්වය තහවුරුකිරිම. | • පසුගිය සමයේ ඇතිකර ගත් ද්වීපාර්ශවීය ගිවිසුම් වල අහිතකර කොන්දේසි නැවත සළකා බැලීම.<br>• දේශීය ආර්ථිකයට හානි කර ගිවිසුම් වලට අත්සන් නොකිරීම. |
| | | කලාපීය ආරක්ෂාව තහවුරු කිරීම | • ආසියානු රටවල් සමඟ ශක්තිමත් ආර්ථික හා වෙළඳ සම්බන්ධතා ඇතිකර ගැනීම. |
| | | | • ඉන්දියාව, සාර්ක් හා බිම්ස්ටෙක් රටවල් සමඟ සමීපව ක්‍රියා කිරීම. |
| | | ගෝලීය වෙළඳපොළෙන් වාසි ලබා ගැනීම | • මැදපෙරදිග හා ගිනිකොණදිග රටවල්; වියට්නාමය, ඉන්දුනීසියාව හා මැලේසියාව වැනි රටවල් සමඟ වෙළඳ සබඳතා ඇතිකර ගැනිම. |

# 4 පරිච්ඡේදය
## එලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්

**“මානව සම්පත් සංවර්ධනය හරහා දැනුම මත පදනම් වූ ආර්ථිකයක්”**

- දැනුමෙන් පිරිපුන් සමාජයක්
- මව්තුරුලෙන් ගුරුමව් සෙවණට
- පාසල් අධ්‍යාපනයේ නවෝදය
- විශ්වවිද්‍යාල හා උසස් වෘත්තීය අධ්‍යාපනය
- සෞඛ්‍ය සේවාවට මුල්තැන
- ජවසම්පන්න තාරුණ්‍යය
- ජවසම්පන්න දේශයක් සඳහා ක්‍රීඩාව
- ඥානබල සහිත ළමා පරපුරක්
- සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක්
- විශේෂ හැකියාවන් හා ආබාධ සහිත පුද්ගලයන්
- ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක්
- “රට වෙනුවෙන් වැඩ” සංස්කෘතියක්
- විදේශ රැකියා බලකාය
- සැම පවුලකටම සුවපහසු නිවහනක්

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| **අධ්‍යාපනය** | දැනුමෙන් පිරිපුන් සමාජයක් | පාසල් අධ්‍යාපනයේ නවෝදය<br>තනි විෂයය **නිර්දේශයක් හඳුන්වා දීම** | පෙර පාසල් අධ්‍යපනයේ සිට තෘතීක අධ්‍යාපනය දක්වා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම<br>සියළු ආයතන එක් අමාත්‍යාංශයක් යටතට ගැනීම<br>විෂයය නිර්දේශ හා පැවරුම් සරල කරන අතර, ක්‍රීඩා සෞන්දර්ය,විදේශිය භාෂා සහ පුස්තකාල පරිහරණය සඳහා අමතර කාලයක් ලබාදීම<br>පූර්ව ළමාවිය මධ්‍යස්ථාන සහ පෙරපාසල් ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම සඳහා මධ්‍යම රජය යටතේ එහි අධීක්ෂණ කටයුතු සිදුකිරීමට යාන්ත්‍රණයක් හඳුන්වාදේ<br>සියළුම පෙර පාසල් ගුරුවරුන්ට ළමා මනෝවිද්‍යාවද ඇතුලත් වන පරිදි අවශ්‍ය දැනුම ලබා දීම සඳහා අනිවාර්ය ගුරු පුහුණු වැඩසටහන් හඳුන්වා දේ |
| | | විෂයයමාලා සංවර්ධනය **yd** ගුණාත්මක අධ්‍යාපන සංවර්-ධනය | දිස්ත්‍රික් පදනම වෙනුවට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා පාසල් පදනම් වූ නව විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දීම<br>දරුවාගේ බුද්ධිය විමසන දියුණු විද්‍යාත්මක ක්‍රමවේදයක් 6 වසරේදී හඳුන්වා දී ඊට අනුරූපව උසස් අධ්‍යාපන අවස්ථා සඳහා මඟපෙන්වීම |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ජාත්‍යන්තර භාවිතයන්ට අනුව අ.පො.ස.(සා.පෙළ) හා (උ.පෙළ) විභාග සඳහා වන වයස් සීමාවන් වෙනස් කෙරේ<br>අධ්‍යාපන පද්ධතිය තුල දරුවන් අපයෝජනය සහමුලින් තුරන් කරන අතර ශාරීරික හා මානසික දඬුවම් වලට ලක් කිරීම සම්පූර්ණයෙන් වැලැක්වේ |
| | | ගුරු පුහුණුව හා වෘත්තීමය සංවර්ධනය | දැනට පවත්නා ගුරු විද්‍යා පීඨ 18 විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම<br>නව පරිපාලන ප්‍රතිසංස්කරණ යටතේ ගුරුවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා අධ්‍යාපන පරිපාලන නිළධාරීන් සඳහා සංවෘත එක් සේවාවන් ස්ථාපිත කිරීම<br>ජාතික හා පළාත් පාසල් අතර ගුරු ස්ථානමාරු සඳහා අවශ්‍ය නෛතික වෙනස් කම් සිදු කිරීම<br>අති දුෂ්කර ග්‍රාමීය පාසල්වල සේවය කරන ගුරුවරුන් සඳහා අමතර දීමනාවක් ලබා දීමට කටයුතු කෙරේ |
| | | පාසල් පද්ධතියේ යටිතල පහසුකම් සංවර්ධනය | ග්‍රාමීය පාසල් සඳහා නවීන තාක්ෂණය සහිත යටිතල පහසුකම් හා අවශ්‍ය මානව සම්පත ලබාදීම<br><br>සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට පාසල් 03 බැගින් සංවර් ධනයකර පොකුරු පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම<br><br>ත්‍රෛභාෂා අග්‍රගන්‍ය සුපිරි ජාතික පාසල් 20ක් රටපුරා පළමු වසර දෙක තුළ පිහිටුවීම<br><br>ප්‍රාථමික පාසල් ‘ළමා මිතුරු පාසල්’ ලෙස සංවර්ධනය **කිරීම හා ඒවාට අවශ්‍ය මානව සම්පත ලබා දීම**<br><br>පාසල් ශිෂ්‍යයන්ට හා ගුරුවරුන්ට රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධව සකස් කරන ලද ප්‍රවාහන සේවයක් ස්ථාපිත කිරීම<br><br>ඉගෙනුම්, ඉගැන්වීම් හා දැනුම බෙදාහැරීම සඳහා ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කෙරේ |
| **උසස් අධ්‍යාපනය** | විශිෂ්ඨ උසස් අධ්‍යාපන පද්ධතියක් | සුදුසුකම් සහිත සියළු සිසුන්ට උපාධි මට්ටම දක්වා අඛණ්ඩ උසස් අධ්‍යාපනයක් | අවශ්‍ය භෞතික හා මානව සම්පත් ලබා දෙමින් විශ්ව විද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපය ආයතන සඳහා ඇතුලත් කරනු ලබන සිසුන් ප්‍රමාණය ඉහළ නැංවේ<br><br>සියළුම විශ්වවිද්‍යාල සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල බවට පත් කිරීම හා තාක්ෂණවේදීන් බිහි කිරීම සඳහා තාක්ෂණ පීඨ ආරම්භ කිරීම |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ගුවන්සේවා විශ්වවිද්‍යාලයක් හා නාවික සේවා විශ්වවිද්‍යාලයක් පිහිටුවීම<br><br>නව විෂයයමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සිසුන්ට අවශ්‍ය අරමුදල් හා පොලී රහිත සහන ණය ලබා දීම<br><br>නේවාසිකාගාර පහසුකම් සැපයීමට රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල්කාරී ක්‍රමවේදයක් හඳුන්වා දීම<br><br>සෞන්දර්යය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විශ්වවිද්‍යාල විද්‍යායතන 10 ක් ආරම්භ කිරීම<br><br>දුරස්ථ අධ්‍යාපන පාඨමාලා හැදෑරීමට විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය පුළුල් කිරීම<br><br>රාජ්‍ය විශ්වවිද්‍යාල, සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ජාත්‍යාන්තර ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය **කිරීම**<br><br>නවකවද සංස්කෘතිය සියළු විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වලින් මුළුමනින්ම තුරන් කිරීම<br><br>දේශීය හා විදේශීය රැකියා අවස්ථා සපුරාලීමට අවශ්‍ය නව පුහුණු පාඨමාලා සහ පවතින පුහුණු පාඨමාලා උසස් කිරීම සඳහා වෘත්තිය ආයතන (Professional Organizations) දිරිගැන්වේ<br><br>මහපොළ ශිෂ්‍යාධාර දීමනාව ඉහල නැංවේ |
| **වෘත්තීය පුහුණුව හා නිපුණතා අධ්‍යාපනය** | නිපුණතාවෙන් සපිරි සමාජයක් | නුපුහුණු ශ්‍රමිකයන් අඩු කර **කඩිනම් සංවර්ධනයක් අත් කර ගැනීමට පුහුණු, ක්‍රියාශීලී ශ්‍රමබලකායක් බිහිකරීම** | අධ්‍යාපන සුදුසුකම් නොසළකා අවශ්‍ය සිසුන්ට වෘත්තීය හා තාක්ෂණ පුහුණු අවස්ථා ලබා දීම<br><br>පවතින වෘත්තිය පුහුණු ආයතන විධිමත් ඇගයීමකට ලක් කර “One TVET” සංකල්පය යටතේ එම ආයතන ජාලගත කරන අතර ජර්මන් කාර්මික අධ්‍යාපk ආයතනයේ ක්‍රියාකාරීත්වය ද පුළුල් කෙරේ<br><br>දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්මට තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූපව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ශ්‍රම බලකායේ නිපුණතා සංවර්ධනයට පුළුල් අවස්ථා ලබා දීම<br><br>වෘත්තිය හා තාක්ෂණික ක්ෂේත්‍රයේ ඉගෙනුම ලබන සිසුන් සඳහා මුලාධාර සහ විදේශ භාෂා සහ ගණිතය හැදැරීමට අවකාශ සලසා දේ |
| **බටහිර වෛද්‍ය ක්ෂේත්‍රය** | රෝග සෑදීමෙන් පසු ප්‍රතිකාර කිරීම වෙනුවෙන් “නිරෝගීතාව” මුලික කරගත් ප්‍රතිපත්තිය | “සුව දිවිනැගුම” වැඩසටහන ක්‍රියාත්මක කරමින් සෞඛ්‍යමත් ජීවිතයක් ගත කිරීමට දිරිගැන්වීම | වස විසෙන් තොර නීරෝගී ආහාර වේලක් ප්‍රචලිත කිරීම<br>කාබනික ආහාර නිෂ්පාදනය ප්‍රචලිත කිරීම<br>සියළු වයස් කාණ්ඩ සඳහා නිවැරදි ආහාර පුරුදු පුහුණු කිරීම<br>වාතය, ජලය හා භූමිය දූෂණය වලක්වමින් නීරෝගී පරිසරයක් තහවුරු කිරීම.<br>බෝවන රෝග තුලින් හඳුනාගැනීම සඳහා ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා මත්පැන් හා මත් ද්‍රව්‍ය භාවිතය අවම කරමින් මත්ද්‍රව්‍ය භාවිතය සමාජයෙන් මුලිනුපුටා දැමීමට කටයුතු කෙරේ<br><br>සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීම සඳහා ශාරීරික ව්‍යායාම් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කෙරේ<br>පැය විසිහතර තුලම ක්‍රියාත්මක නොමිලේ සේවාව ලබාගත හැකි ජංගම දුරකථන සේවාවක් සහිත අන්තර්ජාල මනෝ උපදේශන සේවාවක් ස්ථාපිත කෙරේ.<br>හෙද පුහුණු විද්‍යාල, උපාධි පිරිනමන තත්ත්වයට උසස් කෙරේ.<br>වෛද්‍යවරුන් සඳහා වන පශ්චාත් උපාධි අවස්ථා පුළුල් කෙරේ. |
| | සෞඛ්‍ය සේවා පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | සෞඛ්‍ය සේවා පහසුකම් සංවර්ධනය සඳහා වන වාර්ෂික ආයෝජන ඉහළ නැංවේ | රෝගීන් සඳහා වන පොරොත්තු ලේඛණ, දිගු පෝලිම් හා තදබදය අවම කෙරේ<br>කොළඹ ජාතික රෝහල ජාත්‍යන්තර මට්ටමට උසස් කෙරේ<br>සෑම දිස්ත්‍රික්කයකම තෝරාගත් එක් රෝහලක් ජාතික රෝහල මට්ටමටම වැඩි දියුණු කෙරේ<br>සියළුම රෝහල් සඳහා අත්‍යාවශ්‍ය භෞතික හා මානව සම්පත් සපයන අතර එම රෝහල් මඟින් අදාල රෝගීන් නියමිත රෝහල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් හඳන්වාදේ<br>රෝග විනිශ්චය සඳහා දියුණු ක්‍රමවේද හඳුන්වා දීම<br>වෛද්‍යවරුන් මෙරට රඳවා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම<br>සියළු දෙනාට ආරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා සියළුම රජයේ හා පෞද්ගලික සෞඛ්‍ය වෛද්‍ය ආයතනවල ISO තත්ත්ව සහතික මට්ටම ස්ථාපිත කිරීම<br>සියළු රෝහල් , බෙහෙත් ශාලා හා රසායනාගාර නියාමනය සඳහා නියාමන අධිකාරියක් |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | පිහිටුවා පිළිගත් ප්‍රමිතීන් පවත්වාගෙන යාම<br>අත්‍යවශ්‍ය ඖෂධවල අවම ආරක්ෂක තොග මට්ටම පවත්වාගෙන යාම<br>ඖෂධවල ගුණාත්මක භාවය තහවුරු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ වලට යටත්ව රසායනාගාර පවත්වාගෙන යාම |
| | සෞඛ්‍ය සේවාව සඳහා වන සියළුම වියදම් ශ්‍රී ලාංකිකයින් සඳහාය | රජයේ සෞඛ්‍ය සේවා පහසුකම් නොමිලයේ විදේශිකයන්ට ලබාදීම අත්හිටුවේ | |
| **දේශීය වෛ ද්‍ය හා ආයුර් වේද අංශය** | රට තුල හා ගෝලීය සමාජය තුල හිමි ස්ථානය හිමිකරගැනීම | වඩාත් විද්‍යාත්මක හා නවීන ක්‍රමවේදයක් තුල දේශීය හා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම. | ජාතික දේශීය වෛද්‍ය සභාව හා ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාව ලියාපදිංචි කිරීම හා දේශීය වෙද මහතුන් දේශීය වෛද්‍යවරුන් ලෙස ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් සැකසීම<br>පිළිගත් ප්‍රමිතීන්ට අනුව ආයුර්වේද රෝහල් වැඩි දියුණු කිරීම<br>රෝග නිවාරණය සඳහා පහසුකම් ලබා දීම.<br>ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා පහසුකම් ලබා දීම<br>දේශීය ඖෂධ හා වෛද්‍ය ක්‍රම පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම හා ඒවා ලියාපදිංචි කිරීම<br>ආයුර්වේද රූපලාවන්‍ය ඖෂධ ආලේපන අපනයනය සඳහා නිෂ්පාදනයට හා සියළුම ඖෂධ පැළෑටි වගා කිරීම සඳහා පහසුකම් සැපයීම.<br>ආයුර්වේද විද්‍යායතනය විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම<br>දේශීය ආයුර්වේද ඖෂධ සංග්‍රහය යාවත්කාලීන කිරීම<br>සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට ආයුර්වේද සිද්ධ , යුනානි, දේශීය පාරම්පරික හා හෝමියෝපති ප්‍රතිකාර ක්‍රම සංවර්ධනය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ |
| **තරුණ කටයුතු** | ජව සම්පන්න්‍ය තාරුණ්‍යයක් බිහි කිරීම | නිශ්චිත හා ස්ථිර වැඩපිළිටවළක් යටතේ විසඳුම් ලබා දීමෙන් තරුණ පරපුර සවිබල ගැන්වීම | දේශපාලන තීන්දු තීරණ ගැනීමේදී තරුණ සහභාගීත්වය වැඩි කිරීම<br>තරුණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීමට අවශ්‍ය අවස්ථාව හා දිරිගැන්වීම් ලබා දීම<br>දේශීය හා විදේශීය රැකියා අවස්ථා හඳුනාගැනීමට තරුණ ව්‍යාපාරික මා**ර්ගෝපදේශක මධ්‍යස්ථාන ක්‍රමයක් ආරම්භ කිරීම**<br>**රාජ්‍ය** සේවයේ පහළම ශ්‍රේණි සඳහා බඳවාගනු ලබන සුදුසුකම් වර්තමාන අවශ්‍යතාව මත සංශෝධනය කෙරේ<br>ස්මාර්ට් ජංගම දුරකථනයක්, ටැබ් යන්ත්‍රයක් හෝ ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායයන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ගැනීම සඳහා පාරිභෝගිකයන්ට පහසු ගෙවීමේ ක්‍රමවේදයක් හඳුන්වාදේ |
| **ක්‍රීඩා කටයුතු** | ජව සම්පන්න දේශයක් සඳහා ක්‍රීඩාවේ සවිබලය | ජවසම්පන්න, නිරෝගිමත් සහ විනයගරුක සමාජයක් බිහි කිරීම | ක්‍රිඩාවෙහි දක්ෂ සිසුන් සඳහා අවශ්‍ය පෝෂණය, පුහුණුව හා අනෙකුත් පහසුකම් ලබා දීම<br><br>ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම<br><br>පළාත් මට්ටමින් ක්‍රීඩාගාර ඇති කිරීම/සංවර්ධනය **කිරීම**<br><br>ක්රීඩා ක්ෂේත්‍රෙය් පුහුණුකරුවන්, උපදේශකයින් හා භෞතික චිකිත්සකවරුන් බිහි කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් සකස් කිරීම |
| **ළමා කටයුතු** | ඥානබල සහිත ළමා පරපුරක් ඇති කිරීම | නිරෝගීමත් හා මනා **පෞරුෂයකින් යුත් ශ්‍රී ලාංකිකයෙකු බිහි** | අඩු ආදායම් ලාභී පවුල් වල දරුවන්ට මූල්‍යමය හා අනෙකුත් පහසුකම් ලබා දීම<br><br>කායික දණ්ඩනයකට, අපයෝජනයකට, වෙනස්කමකට හා හිංසනයකට ලක් වීම වැළැක්වීම සඳහා අධිකරණ, ළමා හා කාන්තා කටයුතු හා ආරක්ෂක අමාත්‍යාංශ ඇතුළු සියළු රාජ්‍ය ආයතන එක්ව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම<br><br>මන්දපෝෂණය දුරුකිරීම සඳහා විශේෂ ළමා පෝෂණ වැඩසටහනක් හඳුන්වාදේ<br><br>සෑම දිස්ත්‍රික් අධිකරණයකම වෙනමම අංශයක් දරුවන් සම්බන්ධව පමා වෙමින් ඇති සියළු නඩු විසදීම සඳහා වෙන් කිරීම<br><br>ළමා මධ්‍යස්ථාන වල සිටින දරුවන් සඳහා කැපකාර පවුල් ක්‍රමයක් ඇති කිරීම සඳහා ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම<br><br>දරුවන්, දරුකමට හදාවඩා ගැනීමට ඇති සංකීර්ණ ක්‍රමවේදය සරල කෙරේ |
| **කාන්තා කටයුතු** | **ආර්ථිකමය හා සාමාජීය වශයෙන් කාන්තාව සවිබල ගැන්වීම** | **සංවර්ධන සැළසුම් සඳහා කාන්තාවන්ගේ දායකත්වය ඉහළ නැංවීම** | ශ්‍රම බලකායට කාන්තා දායකත්වය වැඩි කිරීමට ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඉහළ ප්රමිතියකින් පවත්ගෙන යාම හා විධිමත්ව නියානමය කිරීම<br><br>තරුණ මව්වරුන් සඳහා නම්‍යශීලී වැඩ කිරීමේ අවස්ථා ඇති කිරීම |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ග්‍රාමීය කාන්තාවන් සඳහා ගෘහස්ථ ව්‍යවසායන් ඇති කිරීම.<br><br>කාන්තාවන්ට සිදු වන සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් අවම කිරීම සඳහා උපදේශනය හා උපකාර කිරීමට පැය 24 ක්‍රියාත්මක වන උපදේශන සේවාවක් ඇති කිරීම සහ තමන්ට සිදුවන හිංසාවක් හෝ පීඩනයක් ආසන්න පොලිස් ස්ථානයට ජංගම දුරකථනයෙන් වාර්තා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වාදේ |
| **සමාජ ආරක්ෂණය** | වෙනස් හැකියාවන් සහිත සහ ආබාධිත පුද්ගලයින්ට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. | සමාන අවස්ථා ඇති කිරීම තුළින් ඔවුන්ගේ මුළු ධාරිතාවය ආර්ථික සංවර්ධනයට ලබා ගැනීම. | ආබාධ සහිත පුද්ගලයන්ට පාසල් සහ විශ්වවිද්‍යාල වල අධ්‍යාපනය ලැබීමේදී සහ පොදු විභාග ප්‍රශ්න පත්‍ර වලට මුහුණ දීමේදී සිදු වන දුෂ්කරතා ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දීම<br><br>ශ්‍රවණාබාධිතයින් භාවිතා කරන සංඥා පිළිබඳ භාෂා පරිවර්තකයින් සංඛ්‍යාව ඉහළ නැංවේ<br><br>විශේෂ හැකියාවන්ගෙන් යුත් පුද්ගලයින්ගේ ගැටළු නිරාකරණය සඳහා වෙනම අධිකරණයක් ස්ථාපිත කෙරේ<br><br>විශේෂ හැකියා/ වෘත්තිමය පුහුණු වැඩසටහන් ඇති කිරීම.<br><br>සන්නිවේදන පහසුකම් ඇති කිරීමට ඇමතුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම.<br><br>හස්ත සංඥා භාවිතය සියලු රූපවාහිනී මාධ්‍ය ආයතන වල ප්‍රචලිත කිරීම<br><br>ආබාධිත පුද්ගලයින්ට රස විඳිය හැකි ලෙස නිපදවන සිනමා හා නාට්‍ය නිර්මාණය සඳහා බදු සහන හඳුන්වාදේ |
| **වැඩිහිටි සුබසාධනය** | ගෞරවාන්විත ජ්‍යේෂ්ඨ පුරවැසි සමාජයක් | ගෞරවයෙන් යුක්තව ජීවත් වීමට අවශ්‍ය සුබසාධන ක්‍රමවේදයක් ඇති කිරීම. | වැඩිහිටියන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය නැවත අධීක්ෂණය කර ක්‍රියාත්මක කෙරේ<br><br>වියපත්භාවයේ අභියෝග ජය ගැනීමට සකස් කොට ඇති පස් අවුරුදු සැලැස්ම ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම.<br><br>'ස්වේච්ඡා සේවා බලකාය' ආරම්භ කිරීම තුළින් ඔවුන්ගේ දැනුම හා පළපුරුද්ද අනාගත |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | පරපුරට ලබා ගැනීම<br><br>නිෂ්පාදන කාර්යයට දායක වීමට කැමති ජේෂ්ඨ පුරවැසියන් සඳහා අවශ්‍ය ජීවනෝපාය සංවර්ධන පුහුණු වැඩසටහන් පෞද්ගලික අංශයද සහයෝගය ඇතිව ක්‍රියාත්මක කෙරේ<br><br>දැනට ලබා දෙන රු. 2000 ක වැඩිහිටි දීමනාවෙන් කපා හැර ඇති රු.100ද නැවත එක් කර දීමනාව රු.2500 දක්වා ඉහළ දැමීමට කටයුතු කිරීම.<br><br>අවුරුදු 60ට වැඩි ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා නිර්දේශිත ඖෂධ මිලදී ගැනීමේදී සහනාධාර ක්‍රමයක් ඇති කිරීම.<br><br>වැඩිහිටි නිවාස සඳහා නිසි ප්‍රමිතියක් ඇති කිරීම.<br><br>ජ්‍යේෂ්ඨ පුරවැසියන්ට තම තමන්ගේ ආගමට අනුකූල ප්‍රධාන ආගමික ස්ථාන වැඳ පුදා ගැනීම සඳහා අඩු පොලී සහනදායී ණය ලබා දීම. |
| **රාජ්‍ය සේවය** | 'රට වෙනුවෙන් වැඩ' සංස්කෘතියක් | මහජන හිතෛෂී රාජ්‍ය සේවයක් ඇති කිරීම. | රාජ්‍ය සේවයේ ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දීර්ඝ කාලීන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කෙරේ<br><br>ස්වාධීන රාජ්‍ය සේවයක් ඇති කිරීම සඳහා අවශ්‍ය නව සේවා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම.<br><br>අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ඇති රාජ්‍ය, සහ පෞද්ගලික අංශයේ සමස්ථ සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සේව්‍ය දායකත්වය 12% සිට 15% දක්වා වැඩි කර සේවක ඉතුරුම් ඉහළ නැංවීම.<br><br>රාජ්‍ය, අර්ධ රාජ්‍ය, සංස්ථා සහ බැංකු සේවයේ සියලුම ආයතන වල සත්භාවයෙන් යුක්තව රාජකාරියේ යෙදෙන රාජ්‍ය නිලධාරීන්ට මුක්තිය හිමි වන පරිදි අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ඇති කිරීම.<br><br>රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට රැකියා අහිමි වන අවස්ථාවකදී නැවත රැකියාවක් සොයා ගන්නා තෙක් මාසික දීමනා රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම. |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
| --- | --- | --- | --- |
| | | | පළාත් පාලන සේවය ඇතුළු රාජ්‍ය සේවයේ පහළම ශ්‍රේණිවලට අයත් සේවකයන් වෙනුවෙන් සනීපාරක්ෂක දීමනාවක් ලබා දීම.<br><br>වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්ලාභීන්ට ප්‍රමාදයකින් තොරව විශ්‍රාම වැටුප ලබා දීම.<br>සේවක අර්ථසාධක අරමුදලේ සමාජිකත්වය ඇති රාජය හා පෞද්ගලික අංශයේ සේවකයෙකු රාජකාරී කාලය තුල මියගිය විට වැන්දඹුවට සේවකයා විසින් වැටුප් ගෙවීම අනිවාර්ය කිරීමට නීති හඳුන්වාදේ.<br><br>අවශ්‍ය සේවාවන් සඳහා නව සේවා ව්‍යවස්ථා හඳුන්වාදේ<br><br>වැටුප් හා විශාම වැටුප් වල පවතින විෂමතා ඉවත් කිරීම සඳහා වෙනම කොමිෂමක් පත් කෙරේ<br><br>රාජ්‍ය අංශයේ සේවක ආරවුල් විසඳීම සඳහා බේරුම්කාර ක්‍රියාවලියක් හඳුන්වා දේ<br><br>රාජ්‍ය අංශයේ සේවක අර්ථසාධක අරමුදලට අමතරව විශේෂ දායකත්ව විශ්‍රාම වැටුපක් අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ට හඳුන්වා දේ<br><br>විශ්‍රාමික පාරිතෝෂිකය මත අය කරන බදු අඩු කෙරේ |
| **පෞද්ගලික අංශය** | පෞද්ගලික අංශයේ සේවකයින් ආරක්ෂා කිරීම. | සුදුසු රැකියා පරිසරයක් ඇති කිරීම. | දැනට පෞද්ගලික අංශයේ සේවකයාගේ රු. 10000ක අවම වැටුප රු.2500කින් ඉහළ නැංවීම.<br><br>නව සේවකයින් සේවයට එක් වී සතියක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම අනිවාර්ය කිරීම.<br><br>අවශ්‍ය අණපනත් සංශෝධනය කිරීම තුළින් සුදුසු රැකියා පරිසරයක් ඇති කිරීම. |
| **විදේශ රැකියා** | විදේශ රැකියා බලකාය අගය කිරීම. | ප්‍රතිලාභ සැලසීම තුළින් විදේශයන්හි රැකියා කිරීම දිරිමත් කිරීම | විදේශ ගත ශ්‍රමිකයන් මෙන්ම විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකිකයන් උපයන විදේශ විනිමය ආදායම් බදු වලින් නිදහස් කරන අතර එම මුදල් බැංකු වල විදේශ මුදල් ඉතුරුම් ලෙස තබා ගැනීමේදී අය කරන බදු සම්පූර්ණයෙන් ඉවත් කිරීම.<br><br>විදේශ රැකියා නිම කර පැමිණෙන පුද්ගලයින් සඳහා බදු නිදහස් ව්‍යාපාර ආරම්භ කිරීමට |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | විශේෂ ව්‍යාපෘති ණය ලබා දීම.<br><br>වසරකට ඩොලර් 50 000 බැගින් වසර 10ක් විදේශ විනිමය අඛණ්ඩව එවන විදේශ ගත ශ්‍රමිකයන් මෙන්ම විදේශ රටවල පදිංචි ශ්‍රී ලාංකිකයන්ට තීරු බදු රහිත වාහන බලපත්‍රයක් ලබා දීම.<br><br>වසර 6 කට වඩා වැඩි කාලයක් විදේශගතව සේවය කරන්නන්ට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.<br><br>නුපුහුණු ශ්‍රමිකයන් වෙනුවට පුහුණු ශ්‍රමිකයන් යැවීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම.<br><br>විදේශ රටවලදී විවිධ අනතුරු වලට ලක්වන්නන්ට හිමි වන්දි ලබා ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා නීතිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම. |
| **නිවාස** | සෑම පවුලකටම සුව පහසු නිවාසයක් | නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා මහල් නිවාස යොජනාක්‍රම දියත් කිරීම.<br><br>ජනතාවට නිවාස පහසුවෙන් මිලදීගැනීම සඳහා සහනදායී මූල්‍ය පහසුකම් සකසා දීම | පැරණි මහල් නිවාස නව මහල් නිවාස මගින් ප්‍රතිස්ථාපනය කිරීම<br><br>අවතැන්වූවන් සහ පැල්පත්වාසීන් සඳහා පහසුකම් සහිත නාගරික නිවාස යෝජනා ක්‍රම හරහා නිවාස ලබා දීම<br><br>කුලී පදනම මත තාවකාලික නේවාසිකත්වයන් අපේක්ෂා කරන්නන් සඳහා සධාරණ කුලී පදනම මත මහල් නිවාස යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.<br><br>නිවාස ඉදිකිරීමට භූමිය සීමාසහිත ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රදේශයන්හි කෘෂිකාර්මික කටයුතුවල සුරක්ෂිතබව ආරක්ෂා කරමින් සියලු පහසුකම් වලින් සපිරි නිවාස යෝජනා ක්‍රම ඇති කිරීම<br><br>නිවාස අවශ්‍ය පුද්ගලයින්ට ආදායම මත පදනම්ව පහසු ගෙවීමේ ක්‍රමයට නිවාස ලබා දීම<br><br>රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන් ලබගන්නා තම පළමු නිවාස ණය වෙනුවෙන් ගෙවන පොළිය ආදායම් බදු ගෙවීමේදී වියදමක් ලෙස සැලකීම<br><br>නිවාස ඉදිකිරීම් ආයතන සඳහා සහනදායි මිල යටතේ ඉඩම් ලබා දීම මගින් අයෝජකයන් |

| අනු අංශය | අංශික ප්‍රතිපත්ති | ක්‍රමෝපායන් | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | දිරිමත් කිරීම |
| | | රාජ්‍ය- පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ නිවාස ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශය සවිමත් කිරීම සහ දිරිමත් කිරීම | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ විශේෂ දීපව්‍යාප්ත නිවාස යෝජනා ක්‍රම හඳුන්වාදීම<br><br>නිවාස ඉදිකිරීම සඳහා ණය ලබා දෙන බැංකු හා රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර නිවාස බැංකුවක් පිහිටුවීම හා පහසු පොලී අනුපාතයන් යටතේ ණය ලබා දීමට ක්‍රමවේදයක් සැලසීම |
| | | නිවාස මූල්‍ය යාන්ත්‍රනය කාර්යක්ෂමව යාමනය කිරීම මඟින් සවිබල ගැන්වීම | |

# 5 පරිච්ඡේදය
## ජනතා කේන්ද්‍රීය ආර්ථිකය

මූලික පරමාර්ථ

ආර්ථිකයේ අයිතිය ජනතාවට හිමි වන ජනතා කේන්ද්‍රීය ජාතික ආර්ථික පිළිවෙතක් කරා ගමන්කිරීම සඳහා ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කිරීම. එහි

- ආර්ථික සම්පත්වල ජනතාවගේ අයිතිය සහතික කිරීම
- ආර්ථික සම්පත් අනාගත පරපුරට උරුම කරදීම
- දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණු වේ.

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව

- විදේශීය ණය ප්‍රමාණය අඩු කිරීමට කටයුතු කිරීම; ඒ සඳහා දේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ආනයන වියදම් අඩු කිරීම සහ අපනයන ආදායම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- අයවැය හිඟය අඩු කිරීම; අත්‍යවශ්‍ය වියදම් සඳහා මුදල් යෙදවීම සහ රාජ්‍ය ආයෝජනවලට ප්‍රමුඛතාවය දීම මඟින් අනවශ්‍ය රජයේ වියදම් ඉවත් කිරීම.
- වෙළඳ හිඟය අඩු කිරීම; දේශීය සම්පත් පදනම් කරගත් අපනයන ප්‍රවර්ධනය කිරීම, ආනයන ආදේශනය සහ අගය එකතු කළ කර්මාන්ත වැඩි කිරීම තුළින් අපනයන ආර්ථිකය පුළුල් කිරීම.
- දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අමුද්‍රව්‍ය සහ අතරමැදි භාණ්ඩ සඳහා ආනයන බදු අඩු කිරීම
- ජාත්‍යන්තරව තරඟකාරී කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ තාක්ෂණික උපකරණ සඳහා ආනයන ගාස්තු රහිතව සිදු කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ද්‍රවශීලතා අරමුදල හරහා අවදානම වැඩි මූල්‍ය ආයතන නැවත ස්ථාවර කිරීම සඳහා කටයුතු කිරීම.
- ආහාර සුරක්ෂිතාවය තහවුරු කිරීම.

**2020 – 2025 සාර්ව ආර්ථික ඉලක්ක.**

- ආර්ථික වර්ධන වේගය 6.5% න් ඉහළට
- ඇ.ඩො. 6500 ඉක්මවා යන ඒක පුද්ගල ආදායමක්
- සේවා වියුක්ති අනුපාතය 4% ට වඩා අඩු අගයක්
- වාර්ෂික උද්ධමන අනුපාතය 5%කට වඩා අඩු අගයක්.
- අයවැය හිඟය ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස 4%ට වඩා අඩු අගයක්
- තනි ඉලක්කම් පොලී අනුපාතයක්.
- රුපියලේ අගය ස්ථාවර මට්ටමක

**කඩිනම් සහන සැලැස්ම.**

- දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, පොදු ජනතාව සවිබල ගැන්වීම සහ විදේශ ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය ආකාරයට හිතකර සරල බදු ක්‍රමයක් හඳුන්වා දීම
- ජීවන වියදම් අඩු කිරීමට, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශවල ජීවනෝපාය කටයුතු පුළුල් කිරීමට සහ දරුවන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීමට උපකාරී වන ආර්ථික ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීම.
- වේගවත් ඉදිරි ආර්ථියක් සඳහා නිෂ්පාදන ආර්ථික ගොඩනැංවීමට අත්‍යාවශ්‍ය වන ආනයන-අපනයන වෙළඳාම, ඉදිකිරීම් කර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ කෘෂිකර්මාන්තය වැනි අංශ දියුණු කිරීම සඳහා අවශ්‍ය සහන පොලී ණය දිගු කාලීන ගෙවීමේ පදනමක් යටතේ ලබා දිය හැකි නවක්‍රමවේදයන් සහිත ‘ජාතික සංවර්ධන බැංකුව’ නමින් නව බැංකුවක් ස්ථාපනය කිරීම.
- ආයෝජකයින් තුළ විශ්වාසය ගොඩනැගීම සඳහා කොළඹ කොටස් වෙළඳපොල යළි නඟා සිටුවීම.

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
| --- | --- | --- | --- |
| **කෘෂිකර්මාන්තය** | උසස් තාක්ෂණික නවෝත්පාදනයන් තුළින් කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම.<br><br>ආරක්ෂිත ආහාර සඳහා ජනතාවට ඇති අයිතිය සුරක්ෂිත කරමින් සෞඛ්‍ය සම්පන්න සහ ක්‍රියාකාරී ප්‍රජාවක් ගොඩනැගීම.<br><br>නව තාක්ෂණයන්හි සහාය ඇතිව විවිධ අගය එකතු කළ නිෂ්පාදන හරහා අපනයන ව්‍යාපාරය ශක්තිමත් කිරීම. | දැනට ඇති සියළු ප්‍රතිපත්ති සමාලෝචනය කර ස්ථාවර 'නව ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියක්' හඳුන්වා දීම<br><br>විශ්ව විද්‍යාල සහ, පර්යේෂණ ආයතන වල ධාරිතාවයන් වැඩි දියුණු කිරීම.<br><br>හොඳ බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීම මඟින් කෘෂිකාර්මික නිෂ්පාදනය පුළුල් කිරීම.<br><br>ඉදිරි වසර දහය තුළ කාබනික කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය හා ප්‍රචාරය කිරීමට කටයුතු කිරීම. | ගොවි සුභසාධනය සහතික කිරීම<br>• ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය නැවත ස්ථාපිත කිරීම.<br>• ඉහළ ප්‍රතිලාභ හිමිවන ගොවි රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.<br>• 'කෘෂි අස්වනු කළමනාකරණ ක්‍රමවේදයක්' හඳුන්වාදීම.<br>• ගොවීන්ට, සරල අඩු පොලී ණය ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>• නව බෝග රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම |
| | | | ඉඩම් ඵලදායිතාව වැඩි කිරීම<br>• ඉඩම් උපරිම ඵලදායී භාවිතයට ගෙන ඒමේ ක්‍රමවේදයක් සකස් කිරීම.<br>• ඉඩම් ඵලදායී භාවිතය සඳහා 'පසේ සරුබව කළමණාකරණ අන්තර්සම්බන්ධිත තාක්ෂණික' ක්‍රමවේදයක් හඳුන්වා දීම. |
| | | | කෘෂිකර්මය නවීකරණය කිරීම.<br>• පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය හඳුන්වා දීම<br>• ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම මඟින් වැඩි අස්වනු ලැබෙන ක්‍රමවේදයන් හඳුන්වාදීම මඟින් ජල පරිභෝජනයේ ආර්ථිකය උපරිම කිරීම.<br>• තීරු බදු රහිත සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ජල පොම්ප සහ සූර්ය කෝෂ ආනයනය කිරීම සඳහා පහසුකම් සැපයීම. අධි තාක්ෂණික කෘෂිකර්මාන්තය, ප්‍රවර්ධනය කිරීම සඳහා කලාපීය |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | මට්ටමින් සමුපකාර ගොවිපලවල් ඇති කිරීම<br>• වියළි මිරිස්, බඩ ඉරිඟු, සෝයා, මුං ඇට, කව්පි, ළූණු සහ අර්තාපල් වැනි භෝග නිෂ්පාදනය, ප්‍රවර්ධනය කිරීම මඟින් එම භාණ්ඩ ආනයනය අඩු කිරීම. |
| | | | තරුණ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම<br>• ආනයන තීරුබදු ප්‍රතිලාභ සහ අඩු පොලී ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම<br>• තරුණ කෘෂිකාර්මික ව්‍යවසායකයින් ගොඩනැගීම |
| | | | පොහොර භාවිතයේ නව පෙරළිය<br>• පවතින පොහොර සහනාධාර ක්‍රමය විකල්ප ක්‍රමයක් මඟින් ප්‍රතිස්ථාපනය කිරීම.<br>• කාබනික හා කාබනික නොවන පොහොර ගොවීන්ට නොමිලේ ලබා දීම.<br>• සාම්ප්‍රදායික ගොවි ගම්මාන පමණක් කාබනික පොහොර භාවිතා කරන්නන් බවට පරිවර්තනය කිරීම.<br>• කාබනික පොහොර භාවිතයන් මඟින් කෘෂිකර්මාන්තයේ යෙදෙන ගෙවතු මිලියන 2 ක් පමණ සංවර්ධනය කිරීම.<br>• සියලුම අත්‍යවශ්‍ය පොහොර දේශීයව නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම.<br>• වනාන්තර සහ තෙත්බිම් භාවිතා කරමින් උසස් තත්ත්වයේ ජෛව පොහොර හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම.<br>• නිසි අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ආරම්භ කිරීම. |
| | | | බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය<br>• ජාත්‍යන්තර මට්ටමේ ගුණාත්මක බීජ නිෂ්පාදනය කිරීම සඳහා 'දේශීය බීජ ප්‍රතිපත්තියක්' හඳුන්වා දීම.<br>• ආනයනය බීජවල ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා ප්‍රමිති සහතිකයක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් නිකුත් කිරීම අනිවාර්ය කිරීම.<br>• ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම.<br>• බීජ ආරක්ෂාව සහතික කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ බීජ බැංකුවක් පිහිටුවීම. |
| | | | ඇසුරුම්කරණය සහ ගබඩා කිරීම<br>• කෘෂි නිෂ්පාදන වලට අගය එකතු කිරීමේ සහ සැකසීමේ කාර්යයන්ට කුඩා ව්‍යවසායක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ තීරුබදු රහිතව ආනයනය කිරීම. |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | • අතිරික්ත නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ඇති කිරීම.<br>• කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා මහා පරිමාණ ගබඩා පහසුකම් ඇති කිරීම සඳහා ස්ථාන හඳුනා ගැනීම. |
| | | | අලෙවිකරණය සහ ප්‍රවාහන<br>• සෘජු නිෂ්පාදකයා සහ අපනයන සමාගම්, සැකසුම් ආයතන, තොග වෙළඳ සමාගම් අතර පෙර ගිවිසුම් ක්‍රමය ප්‍රචලිත කිරීම.<br>• නිෂ්පාදන අලෙවිකරණ පහසුකම් සඳහා නව උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම.<br>• දේශිය නිෂ්පාදකයාට මෙන්ම පාරිභෝගිකයාටද සාධාරණ සහ ස්ථාවර වෙළඳපොළ මිල ක්‍රමයක් පවත්වාගෙන යාමට හැකිවන පරිදි දේශීයව නිෂ්පාදනය කළ හැකි කෘෂි නිෂ්පාදන ආනයනය පාලනය කිරීම.<br>• දේශීය කෘෂි නිෂ්පාදන වලින් රට ස්වයංපෝෂිත කිරීම.<br>• ජාත්‍යන්තරව පිළිගත් කාබනික නිෂ්පාදන සහතික කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම<br>• අවශ්‍ය සහතික ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය නවීකරණය කිරීම.<br>• අස්වනු නෙලීමේදී, ප්‍රවාහනයේදී සහ බෙදා හැරීමේදී සිදුවන නිෂ්පාදන නාස්තිය අවම කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන ඒකාබද්ධ කර නව වැඩපිළිවෙළක් හඳුන්වා දීම.<br>• භාණ්ඩ ප්‍රවාහනයේදී දුම්රිය කාර්යභාරය පුළුල් කිරීම සඳහා  අවශ්‍ය දුම්රිය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම. |
| | | | කෘෂිකාර්මික නවෝත්පාදන සඳහා පර්යේෂණ<br>• පර්යේෂණ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රතිපාදන වලින් නිශ්චිත ප්‍රමාණයක් විශ්ව විද්‍යාල සහ අදාළ ආයතන වෙත ලබා දීම.<br>• නවෝත්පාදන සහිත නිෂ්පාදන දේශීය සන්නාමයක් යටතේ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය දේශීය / විදේශීය ආයෝජකයින් හඳුන්වා දීම.<br>• ජීව කෘෂි රසායන ද්‍රව්‍ය ආශ්‍රිත නවෝත්පාදන පර්යේෂණ සහ අඩු වියදම් ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදයන් හඳුනා ගැනීම සඳහා වන පර්යේෂණ දිරිගැන්වීම සඳහා සහාය ලබා දීම.<br>• පර්යේෂකයන්ට ඔවුන්ගේ නවෝත්පාදන සොයා ගැනීම සහ පර්යේෂණ වල නිර්මාණ අයිතිය සහතික කරන පේටන්ට් බලපත්‍ර ලබා දීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කිරීම.<br>• කෘෂිකාර්මික විද්‍යාලවලට තාක්ෂණික පහසුකම් ලබා දීමෙන් කෘෂිකාර්මික අධ්‍යාපනය පුළුල් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා කෘෂිකාර්මික පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම.<br>• කෘෂිකාර්මික පර්යේෂණ සඳහා දායක වන පෞද්ගලික ව්‍යවසායන් සඳහා බදු සහන ලබා දීම. |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | වී ගොවින්ට උදව් කිරීම.<br>• විවිධ වී වර්ග කිලෝග්‍රෑම් එකක් සඳහා සහතික කළ මිලක් සකස් කිරීම.<br>• වී අලෙවිකරණ මණ්ඩලයේ මැදිහත් වීම ඉහළ නැංවීමට සහ ප්‍රමාදයකින් තොරව වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම. |
| | | | **අපනයන බෝග වගාව**<br>• අපනයන බෝග  සඳහා සහතික මිල ක්‍රමයක් හඳුන්වා දීම සහ ලබා ගෙන ඇති ව්‍යාපාරික ණය සඳහා සහන කාලයක් ලබා දීම.<br>• අපනයන බෝග නිෂ්පාදනයේ යෙදී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහනාධාර පොහොර ලබා දීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.<br>• අපනයන බෝග නැවත වගා කිරීම සඳහා සහන කාලයක් සහිත සහන ණය ක්‍රමයක් හඳුන්වා දීම.<br>• ජාත්‍යන්තරව පිළිගත් නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ පද්ධතියක් සහ භූගෝලීය තොරතුරු සහතිකයක් ලබා දීමට කටයුතු  කිරීම.<br>• තේ, රබර් සහ පොල් වගා කර ඇති ඉඩම් කැබලි කර ජනාවාස බවට පත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීම. |
| | | | **තේ**<br>• දේශීය තේ වල ගුණාත්මකභාවය පවත්වා ගෙන යාම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>• දේශිය පිරිසිදු තේ ශ්‍රී ලංකාවේ අනර්ඝතම නිෂ්පාදනයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ තුළ  ප්‍රවර්ධනය කිරීම.<br>• මහා පරිමාණ තොග  අපනයනය වෙනුවට වටිනාකම් එකතුකළ ආකාරයෙන් තේ අපනයනය දිරිමත් කිරීම.<br>• රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම සහයෝගීත්වයෙන් අහිමිවී ඇති තේ වෙළඳපොල නැවත  දිනාගැනීමට කටයුතු කිරීම.<br>• කාබනික තේ වගාව දිරිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම.<br>• නව තාක්ෂණය හඳුන්වා දෙමින් තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැබෑ දායකත්වය සැපයිය හැකි ආකාරයට තේ  පර්යේෂණ ආයතන සංවර්ධනය  කිරීම. |
| | | | **රබර්**<br>• කෙටි කාලයකදී අස්වැන්න ලබා දිය හැකි නව ප්‍රභේද හඳුන්වා දී වගා කරුවා ආරක්ෂා කර ගත |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | හැකි නව වැඩපිළිවෙලක් සහ නිෂ්පාදනය ඉහළ දැමීමට අවශ්‍ය ක්‍රමවේදයක් හඳුන්වා දීම.<br>• අගය එකතු කිරීම සහ තාක්‍ෂණික නවෝත්පාදනයන් පිළිබඳ පර්යේෂණ සිදු කිරීමට පර්යේෂකයන්, විද්‍යාඥයින් සහ නිෂ්පාදකයින් දිරිමත් කිරීම.<br>• කුඩා හා මධ්‍ය පරිමාණ රබර් වතු හිමියන්ගේ සහ නිෂ්පාදකයින්ගේ සමිති ශක්තිමත් කිරීම සඳහා රජ්‍ය අනුග්‍රහය ලබා දීම. |
| | | | **පොල්**<br>• විවිධ පළිබෝධකයන් පාලනය කිරීම සඳහා ජෛව තාක්ෂණික විසඳුම් සංවර්ධනය කිරීම<br>• පොල් නෙලීම සඳහා යන්ත්‍ර හඳුන්වා දීම සහ ඒවායේ භාවිතය පුළුල් කිරීම.<br>• පොල් පර්යේෂණ ආයතනයට සහ පෞද්ගලික රසායනාගාරවලට ඉහළ අස්වැන්නක් ලබා දෙන පැළෑටි ඇති කිරීම සඳහා පහසුකම් සැපයීම.<br>• පොල් බහුලව වගා නොකරන ප්‍රදේශ සඳහා පොල් ප්‍රභේද ඇති කිරීමට අවශ්‍ය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.<br>• රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා තවාන් සංවර්ධනය කිරීමට කුඩා හා මධ්‍යම පොල් වගාකරුවන් දිරිමත් කිරීම.<br>• පොල් වගා කරන්නන්ගේ ආදායම වැඩි කර ගැනීම සඳහා පොල් වගාවන්හි අනු භෝග ප්‍රවර්ධනය කිරීම.<br>• ගෙවතු වල පොල් වගා පුළුල් කිරීම සඳහා ඉහළ අස්වැන්නක් ලබා දෙන දෙමුහුන් පොල් වර්ග<br>• ජනතාව අතර බෙදා හැරීම. |
| | | | **වෙනත් අපනයන භෝග**<br>• සුළු අපනයන භෝග ආනයනය කිරීම සහ නැවත අපනයනය කිරීම තහනම් කිරීමට කඩිනම් පියවර ගැනීම. |
| | | | **කුරුඳු**<br>• කුරුඳු අපනයනය පුළුල් කිරීම<br>• අපනයනය සඳහා කුරුඳු වගා කිරීමට වගාකරුවන්ට පහසුකම් සැලසීම.<br>• කුරුඳු නිස්සාරණය හා ඇසුරුම් කිරීම සඳහා නව තාක්‍ෂණික ක්‍රමවේදයන් සකස් කිරීම සහ එවැනි උසස් තාක්‍ෂණික උපකරණ තීරුබදු රහිතව සැපයීම.<br>• කුරුඳු ආශ්‍රිත අගය එකතු කිරීම සඳහා  NVQ මට්ටමින් තාක්ෂණික පුහුණු පාඨමාලාවක් ඇති කිරීම<br>• අක්කර පහකට අඩු වතු හිමියන්ගේ භාවිතය සඳහා කුරුඳු නිස්සාරණය හා සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම. |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | • කුරුඳු ආශ්‍රිත අගය එකතු කිරීමේ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රම ආරම්භ කිරීම. |
| | | | **ගම්මිරිස්**<br>• ගම්මිරිස් නිෂ්පාදකයින්ට තාක්ෂණික සහාය ලබා දීම සඳහා වැඩපිළිවෙළක් ඇති කිරීම.<br>• අපනයන කටයුතු සඳහා වෙනත් රටවලින් ගම්මිරිස් ආනයනය කිරීම සීමා කිරීම සඳහා ඉහළ තීරුබදු පැනවීම.<br>• ගම්මිරිස් වගාකරුවන්ට අවශ්‍ය උපකරණ හා තාක්ෂණික උපදෙස් ලබා ගැනීමට උපකාරී වන පරිදි,අඩු පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීම.<br>• ගෘහාශ්‍රිත භාවිතය සහ අපනයනය සඳහා ගම්මිරිස් වගා කිරීම සඳහා අපනයන ගම්මාන පිහිටුවීම.<br>• විදේශීය වෙළඳපොලවල් ඉලක්ක කර ගනිමින් කෝමාරිකා සහ ඉඟුරු වැනි නිෂ්පාදන වගා කිරීම සඳහා මූල්‍යාධාර සහ අවශ්‍ය සහාය ලබා දීම.<br>• සියලුම අපනයන බෝග සංවර්ධනය හා වෙළඳපල ව්‍යාප්තිය සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම. |
| **ධීවර අංශය** | ජාතික ආර්ථිකයට දායක වන අතරම ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා ධීවර නිෂ්පාදනවල ස්වයංපෝෂිත තත්ත්වය ළඟා කර ගැනීම. | ජනතාවට පෝෂණය සැපයීම, විදේශ විනිමය ඉපැයීම් ඉහළ නැංවීම සහ රැකියා හා ජීවනෝපාය අවස්ථා ලබා දීම සඳහා ධීවර සංවර්ධන සැලැස්මක් හඳුන්වා දීම. | • වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ගහණය වැඩි කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන් හඳුන්වා දීම.<br>• කලපු වල පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම.<br>• පවත්නා සියලුම ධීවර වරායන් නවීකරණය කිරීම සහ අවශ්‍ය නම් නව ධීවර වරායන් ඉදිකිරීම.<br>• මහා පරිමාණ බෝට්ටු වල මෙහෙයුම් කටයුතු සිදු  කිරීම සඳහා ඔලුවිල් හි ධීවර වරාය සංවර්ධනය කිරීම.<br>• බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංවර්ධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම.<br>• ජාත්‍යන්තර මුහුදේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය ධීවර සමාගම්වලට අවස්ථාව සලසා දීම.<br>• ත්‍රිකුණාමලය ආශ්‍රිතව විශාල දින ධීවර යාත්‍රා තැනීමට හා නඩත්තු කිරීමට පහසුකම් සංවර්ධනය කිරීම.<br>• නවීන සන්නිවේදන පහසුකම්, ශීතකරණ, ඉන්ධන සැපයුම සහ සනීපාරක්ෂක පහසුකම් සහිතව සියලුම ධීවර වරායන්, නැංගුරම් ස්ථාන වැඩි දියුණු කිරීම.<br>• අගය දාමය පුරාම මසුන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අවශ්‍ය  නවෝත්පාදන සඳහා පොලී රහිත ණය ක්‍රමයක් හඳුන්වා දීම.<br>• අභ්‍යන්තර හා ජලජීවී ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා අඩු පොලී ණය, බදු |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | ප්‍රතිලාභ, රක්ෂණ, උපදේශන සහ වෙළඳපල සම්බන්ධීකරණ ආධාර සැපයීම.<br>• පුද්ගලික සමාගම් සහ ව්‍යවසායකයින්ට පහසුකම් සපයමින් ටින් මාළු නිෂ්පාදනය පුළුල් කිරීම.<br>• ධීවර ආශ්‍රිත ගෘහ කර්මාන්තයට කාන්තාවන් සම්බන්ධ කර ගැනීමේ වැඩසටහනක් සකස් කිරීම.<br>• උතුරු හා නැගෙනහිර මුහුදේ අනවසරයෙන් මසුන් ඇල්ලීම තුරන් කිරීම සහ නාවික හා වෙරළාරක්ෂක ඒකක ශක්තිමත් කිරීම සඳහා ඉන්දියාව සමඟ ගැටුම් නිරාකරණ ගිවිසුමක් ඇති කිරීම.<br>• මුහුදු හා මිරිදිය මත්ස්‍යයන් පුළුල් ලෙස බෝ කිරීම සඳහා ධීවර ප්‍රජා සංගම් හා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ආරම්භ කිරීම.<br>• ධීවර ප්‍රජාව සඳහා ඵලදායී රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම.<br>• සාගර විශ්ව විද්‍යාලය භාවිතා කරන තරුණ තරුණියන් සඳහා ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනාකරණ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.<br>• නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා යන දෙදෙනාටම සාධාරණයක් ඉටු කිරීම  සඳහා මත්ස්‍ය නිෂ්පාදන මිල නියම කිරීමේ ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම. |
| **පශු සම්පත්** | ගෘහස්ථ අවශ්‍යතා සපුරාලීම සඳහා දේශීය දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම | | **කිරි නිෂ්පාදනය**<br>• විවිධ භූගෝලීය ප්‍රදේශවලට ගැලපෙන පරිදි ගව වර්ග තෝරාගෙන හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදු කිරීම.<br>• කුඩා වපසරියක ගවයින් විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීම සඳහා “සිරස් ගව මඩු පද්ධතියක්” හඳුන්වා දීම.<br>• උතුරු පළාතේ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම.<br>• කිරිවල ගුණාත්මකභාවය මත පදනම්ව නව කිරි මිල ක්‍රමයක් ස්ථාපිත කිරීම.<br>• ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හරහා උසස් තත්ත්වයේ තෘණ වර්ග හඳුන්වා දීම.<br>• ගුණාත්මක ගව ආහාර සඳහා තීරුබදු අඩු කිරීම.<br>• මධ්‍යම හා මහා පරිමාණ ගව ගොවිපලවල් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් හා ආයෝජන පහසුකම් සැපයීම<br>• කිරි ගබඩා පහසුකම් වැඩි කිරීම සඳහා කුඩා පරිමාණයේ සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන ශීතකරණ පහසුකම් හඳුන්වා දීම<br>• ගොවීන්ට සහ සමුපකාරවලට සහනාධාර මිල ගණන් යටතේ සහ පහසුවෙන් ගෙවිය හැකි කොන්දේසි යටතේ යාන්ත්‍රික කිරි  ලබා ගැනීමේ උපකරණ ලබා දීම.<br>• අපනයනය සඳහා මස් සහ බිත්තර |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | • කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය පුළුල් කිරීම සහ අපනයනය කිරීමට මහා පරිමාණ නිෂ්පාදකයින් දිරිමත් කිරීම.<br>• කුඩා හා මධ්‍යම පරිමාණ නිෂ්පාදකයින් ප්‍රවර්ධනය කිරීමෙන් දේශීය නිෂ්පාදනය පුළුල් කිරීම.<br>• සත්ව ගොවිපලවල් සහ නිෂ්පාදන පහසුකම් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ඵලදායී අධීක්ෂණ පද්ධති හඳුන්වා දීම.<br>• ගෘහස්ථ මට්ටමින් කාබනික මස් නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දීම. |
| **ව්‍යාපාර සහ ව්‍යවසායකත්ව සංවර්ධනය** | දේශිය කර්මාන්ත ගොඩනැගීම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම | ව්‍යවසායකත්ව සංවර්ධනයට පහසුකම් සැපයීම<br><br>නව කර්මාන්තපුර, නිදහස් වෙළඳ කලාප සහ නිදහස් වරාය පිහිටුවීම<br><br>දේශීය ව්‍යවසායකයින් ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම<br><br>අගය එකතු කිරීම දිරිමත් කිරීම<br><br>ඛනිජ සම්පත් ගවේෂණයට නූතන අධිතාක්ෂණය භාවිත කිරීම | • බැංකු ක්ෂේත්‍රය සමඟ සාකච්ඡා කර ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබාදීම වැනි සහන ලබාදීම<br>• නැවත ණය ලබා ගැනීමට බාධාවන ආකාරයට අසාදු ලේඛනයේ (CRIB) සිටින්නේ කෙටි කාල සීමාවක් සඳහා නම් ඔවුන් එම ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා මහ බැංකුවට උපදෙස් දීම<br>• බිඳවැටී ඇති ව්‍යාපාර නැවත නඟා සිටුවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සහන පොළී අනුපාතයක් යටතේ ලබාදීම<br>• ආර්ථික කොරිඩෝවල සහ කොළඹ, හම්බන්තොට නාවික සහ ගුවන් කේන්ද්‍ර ආශ්‍රිතව සියළු පළාත් ආවරණය වන පරිදි කර්මාන්තපුර, නිදහස් වෙළඳ කලාප සහ නිදහස් වරාය 50ක් පිහිටුවීම.<br>• පවතින නිදහස් වෙළඳ කලාප හා කර්මාන්තපුර උපරිම කාර්යක්ෂමතාවයකින් ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් නැංවීම හා නවීකරණය නොපමාව සිදුකිරීම<br>• නිදහස් වෙළඳ කලාප සහ කර්මාන්තපුරවල සිදු විය යුතු කාර්යයන් නිවැරදිව සහ පහසුවෙන් කර ගැනීමටත් නොවිය යුතු දේවල්, සිදුවීම් වැලැක්වීමටත් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම සඳහා පාර්ලිමේන්තු පණතක් ගෙන ඒම<br>• ආනයන අපනයන ක්‍රියාවලිය කාර්යක්ෂමව ඉටු කරගැනීම සඳහා “තනි ඒකාබද්ධ යාන්ත්‍රණයක්” ස්ථාපනය කිරීම<br>• අන්තර් ජාතික ව්‍යාපාර ප්‍රමුඛයන් (International Business Giants) ගේ ව්‍යාපාරික ආයතන වල ප්‍රධාන කාර්යාල කොළඹ සහ වරාය නගරය ආශ්‍රිතව ස්ථාපනය කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම<br>• විදේශ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීම සඳහා පෞද්ගලික අංශයේද සහය ඇතිව යෝජිත නව ආර්ථික සැලැස්ම ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර ප්‍රචාරණ වැඩපිළවෙළක් දියත් කිරීම<br>• ඛනිජ වැලි, ඩොලමයිට්, පොස්පේට්, මැණික් වැනි දැනට හඳුනාගෙන ඇති ඛනිජ සම්පත් |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | වටිනාකම එකතු කිරීමෙන් තොරව අපනයනය කිරීම සීමා කිරීම<br>• අපනයනය කරන ඛනිජ සම්පත් වටිනාකම් එකතු කර ඉහළ අපනයන ආදායමක් ලබාගත හැකි නිෂ්පාදන බවට පත්කර අපනයනය කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම<br>• කපා ඔප දමන මැණික් අපනයනය වෙනුවට නිමකරන ලද ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය නූතන අධිතාක්ෂණික උපකරණ ආනයනය බදුවලින් නිදහස් කිරීම<br>• දැනට භූගත ව සහ සාගර අභ්‍යන්තරයේ ඇතැයි සැලකෙන ඛනිජ සම්පත් නූතන අධිතාක්ෂණ භාවිත කර ගවේෂණය කර රටේ නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට යොදා ගැනීම<br>• මහා පරිමාණ දේශීය ආයෝජකයන්ට අධිතාක්ෂණික නිෂ්පාදන (High Technology Products) අළුතින් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය සියළුම පහසුකම් ලබා දීම<br>• දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කොට ඔවුන්ව සවිබල ගැන්වීමට විශේෂ අවධානයක් යොමු කිරීම<br>• දේශීය ව්‍යාපාරිකයන්ට පහසුවෙන් ම කළ හැකි ව්‍යාපාර ක්ෂේත්‍රවලට විදේශිකයන්ට ඇතුළුවීමට අවසර දීම සීමා කිරීමට කටයුතු කිරීම<br>• නව ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය දීර්ඝකාලීන බදු පදනම යටතේ වන ඉඩම්, ණය පහසුකම්, ව්‍යාපාර උපදේශනය, තාක්ෂණික සහ යටිතල පහසුකම් ආදී සියල්ල ම පහසුවෙන් ලබාදෙන විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම<br>• පාසල් මට්ටමේ සිටම ව්‍යවසායකයත්ව නැඹුරුවක් ඇති කරන වැඩ පිළිවෙළක් ආරම්භ කිරීම |
| **සංචාරක** | පුළුල් පුද්ගල සහභාගීත්වයෙන් පාරිසරික හා දේශීය-සංස්කෘතික හිතකාමී කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම | වාර්ෂිකව සංචාරකයින්ගේ පැමිණීම මිලියන 7 දක්වා වැඩි කිරීමේ අරමුණින් සංචාරක සංවර්ධන වැඩසටහන | • විදේශීය සංචාරකයින් සඳහා නව ආකර්ශනීය ස්ථාන හඳුනා ගැනීම.<br>• සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ව්‍යාපාරික සම්මන්ත්‍රණ, උත්සව, ප්‍රදර්ශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීමට පහසුකම් සැපයීම.<br>• සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ආයෝජන සහ වෙනත් පහසුකම් සැපයීම.<br>• වඩාත් කාර්යක්ෂම ආගමන සහ විගමන ක්‍රියාවලියක් හඳුන්වා දීම<br>• අභ්‍යන්තර ගුවන් තොටුපල නවීකරණය කිරීම<br>• ප්‍රධාන සංචාරක නගර සම්බන්ධ කරන මාර්ග මංසන්ධිවල සංචාරක සේවා මධ්‍යස්ථාන පිහිටුවීම<br>• ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම මඟින් සංචාරක පහසුකම් අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම<br>• ප්‍රධාන සංචාරක නගරවල සංචාරක පුහුණු පාසල් පිහිටුවීම සහ ආකර්ශනීය නිපුණතා සංවර්ධන පාඨමාලා හඳුන්වා දීම |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | • හෝටල්, ප්‍රවාහන, මාර්ගෝපදේශ, ගෘහස්ථ ගුවන් ටිකට්පත් සහ ඇතුළත් කිරීමේ කාඩ්පත් වෙන් කිරීම සඳහා ඉලෙක්ට්‍රෝනික පහසුකම් හඳුන්වා දීම (වෙන්කිරීමේ මෘදුකාංග පද්ධතිය සහ විද්‍යුත් ගේට්ටු පද්ධති)<br>• සංචාරක කර්මාන්තයේ නියළෙන්නන් සංඛ්‍යාව මිලියන දක්වා වැඩි කිරීම<br>• සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ගික අලෙවිකරණ සහ ප්‍රචාරණ වැඩසටහනක් ආරම්භ කිරීම<br>• උසස් තත්ත්වයේ සංචාරක හෝටල් පිහිටුවීමට සහ දැනට පවතින හෝටල් කාමර සංඛ්‍යාව දෙගුණයක් දක්වා වැඩි කිරීමට අවශ්‍ය දිරිදීමනා ලබාදීම.<br>• දේශීය සංචාරක ව්‍යවසායකයින්ට සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට හැකි පරිසරයක් ආරම්භ කිරීම<br>• සංචාරක අංශයේ සේවකයින්ට  අදාල වන කම්කරු නීති සංශෝධනය කිරීම<br>• ගෘහ ආශ්‍රිත හා ප්‍රජා පාදක සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම<br>• සංචාරකයින්ට ඇති විය හැකි අනවශ්‍ය හිරිහැර වැළැක්වීම  සහ  සංචාරකයින්ගේ ආරක්ෂාව සහ රැකවරණය සහතික කිරීම සඳහා<br>• සියලුම සංචාරක මාර්ගෝපදේශකයින් සහ රියදුරන් ලියාපදිංචි කිරීම, පුහුණු කිරීම සහ සහතික කිරීමට කටයුතු කිරීම.<br>• සංචාරක මධ්‍යස්ථාන අසල සංචාරක පොලිස් සේවය ස්ථාපිත කිරීම |
| **ඇඟලුම් කර්මාන්තය** | අපනයන ඉපයීම් වැඩිකිරීම, දළ දේශීය නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාදීම, සේවා නියුක්තිය ඉහළ දැමීම හා ප්‍රාදේශීය සංවර්ධනයට දායක වීමටට අවශ්‍ය පහස්කම් සැපයීම | ඇඟළුම් කර්මාන්තයේ වැඩිදුර සංවර්ධනය සඳහා පහසුකම් සැලසිම<br><br>ක්ෂේත්‍රය සඳහා වන බදු නැවත සලකා බැලිම | • දැනටමත් ආයෝජන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන්  සමඟ ඒකාබද්ධ ව එරාවූර් ප්‍රදේශය තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ඇඟලූම් කර්මාන්ත පුරය ඇරඹීම සඳහා අවශ්‍ය සියළුම යටිතල පහසුකම් ලබා දීම<br>• ඇඟළුම් සහ එවැනි විදේශ විනිමය උපයන කර්මාන්ත මත දැනට පනවා ඇති අසාධාරණ බදු පිළිබඳ සොයා බලා නොපමා ව අවශ්‍ය බදු සංශෝධන ගෙන ඒම |
| **ඉදිකිරීම් කර්මාන්තය** | ශ්‍රී ලංකාවට ආවේණික පරිසර හා මානව හිතකාමී ඉදිකිරීම් | අනුමැතින් ලබාගැනීමේ ක්‍රමවේදය කඩිනම් කිරීම | • ඉදිකිරීම් කර්මාන්තට අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදවීම වැලැක්වීම සඳහා එක් ස්ථානයකින් හෝ අන්තර්ජාලය ඔස්සේ සියළු අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති කිරීම<br>• සියළුම ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීම ගතවන කාලය සති තුනක් |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | කර්මාන්තයක් ඇසුරින් ජාත්‍යන්තරය ජය ගැනීමට අවශ්‍ය පරිසරය සැකසීම | දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත් සමාගම් ආරක්ෂා කිරීම<br><br>බදු සහන ලබා දීම<br><br>ශ්‍රම හිඟය පියවීම සඳහා තාක්ෂණික විසඳුම් වෙත යාමට අවශ්‍ය ආයෝජන සහය ලබාදීම<br><br>උපකොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කිරීම | දක්වා අඩු කිරීම<br>• සියළුම නාගරික ඉදිකිරීම් නාගරික සංවර්ධන සැලසුම්වලට අනුකූල ව සිදුකිරීම නියාමනය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කිරීම<br>• සියළු නාගරික ඉදිකිරීම්වල දී රථ වාහන නැවැත්වීමේ අංගන ඇතිකිරීම අනිවාර්ය කිරීම<br>• කොන්ත්‍රාත්කරුවන් මුහුණ දී ඇති මූල්‍ය අර්බුද විසඳා ගැනීම සඳහා දැනට ලබාගෙන ඇති ණය ගෙවීමට සහන කාලයක් ලබා දීම<br>• ඉදිකිරීම් ක්ෂේත්‍රය මත පනවන ලද සෘජු හා වක්‍ර බදු වෙනුවට 2014 පැවති බදු<br>• ක්‍රමයක් නැවත හඳුන්වා දීම<br>• තට්ටු නිවාස මත පනවා ඇති 15% වැට් බද්ද ඉවත් කිරීම<br>• රාජ්‍ය ඉදිකිරීම් සියල්ල දේශීය ඉදිකිරීම්කරුවන් සඳහා වෙන් කිරිම<br>• ඉදිකිරීම්කරුවන් සහ ඉදිකිරීම් සමාගම් මුහුණ දී සිටින දුෂ්කරතා අවමකර ගැනීම සඳහා නව බැංකු ක්‍රමවේදයක් මහබැංකුව හරහා හඳුන්වාදීමට කටයුතු කිරීම<br>• ඉදිකිරීම් කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගැනීම සඳහා දැනට පවති<br>• බලපත්‍ර ලබාදීම ක්‍රමවේදය සංශෝධනය කිරීම<br>• කම්කරු ශ්‍රම ඌනතාවය සඳහා හැකිතාක් තාක්ෂණික විසඳුම් කරා යොමුවීමට ඔවුනට අවශ්‍ය ආයෝජන සහය ලබාදීම<br>• කායික ශ්‍රමය වෙනුවට යන්ත්‍ර සූත්‍රවලින් වැඩකරන පුහුණු කම්කරුවන් බිහිකිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම<br>• වැඩකරන ශ්‍රම බළකායට අවශය ආරක්ෂාව, නිසි ගරුත්වය සහ ඉහල වැටුපක් ලබා දීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කර දීම<br>• විවිධ ක්ෂේත්‍රවලට අවශ්‍ය උසස් පුහුණුව සහිත ශිල්පීය ශ්‍රේණී සහ තාක්ෂණවේදීන් බිහිකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම<br>• ඉදිකිරීම් සඳහා අවශ්‍ය උපදේශන පහසුවෙන් ලබා ගැනීම සඳහා වෘත්තීය ඉංජිනේරුවන් සහ උසස් තාක්ෂණවේදීන්ගෙන් සමන්විත උපදේශන සභාවක් පිහිටුවීම<br>• ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දේශීය සලකුණ ජාත්‍යන්තර තලයේ සන්නාමයක් බවට පත්කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ඉදිකිරීම් සැලසුම් සකස් කර ගැනීම සඳහා ගෘහ නිර්මාණ ශිල්පීන් ආයතනය, ඉංජිනේරු ආයතනය, විශ්වවිද්‍යාල සහ වෙනත් ආයතන සමග පහසුවෙන් කටයුතු කිරීමේ යන්ත්‍රණයක් හඳුන්වා දීම<br>• උපකොන්ත්‍රාත්කරුවන්ට ආරක්ෂාව සැලසෙන නීති පනත් සම්මත කර දේශීය සුළු සහ මධ්‍ය පරිමාණ උප කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂාව සැලසීම |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | | | |
| **සීනි නිෂ්පාදනය** | දේශීය සීනි අවශ්‍යතාවය රට තුලම නිෂ්පාදනය කිරීම | සීනි නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් සැලසීම හා දිරි ගැන්වීම | • සීනි නිෂ්පාදනය සඳහා අවශ්‍ය උක් වගාකරන භූමි ප්‍රමාණය වැඩි කිරීම<br>• ඉහළ ඵලදායීතාවක් සහිත උක් වර්ග හඳුන්වා දීම<br>• වසා දමා ඇති කන්තලේ ඇතුළු සියළුම සීනි කර්මාන්තශාලා නොපමාව ආරම්භ කිරීම<br>• නව කර්මාන්ත ශාලා ඉදිකිරීමට පෞද්ගලික අංශයට අවශ්‍ය දිරි ගැන්වීම් ලබා දීම<br>• උක් වගාව සඳහා අවශ්‍ය ජලය කාර්යක්ෂමව භාවිත කිරීමට අවශ්‍ය වන තාක්ෂණික දැනුම ලබා දීම හා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම කටයුතු කිරීම |
| **කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත** | අගය එකතු කිරීම් සහිත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ඇති කිරීම | සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ ආයතන අතිච්ඡාදනය (overlap) වීම වැලැක්විම<br><br>අමුද්‍රව්‍ය හිඟය නිම කිරීම | • එක් ආයතනයක් මගින් සියළු සේවා සැපයීමේ ක්‍රමවේදයක් සකස් කිරීම<br>• අගය වැඩිකිරීමේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදෙමින් අවශ්‍ය දිරිගැන්වීම් ලබාදිම<br>• වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය, පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමුද්‍රව්‍ය ගැටළුවටපිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරි ගැන්වීම් ලබා දීම<br>• දැව සහ ලී බඩු නිෂ්පාදකයන් මුහුණ දී සිටින අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අර්බුදයට විසඳුමක් ලෙස තීරු බදු රහිතව පොතු සහිත දැව කඳන් ආනයනයට අවසර දීම<br>• වාත්තු සහ ලෝකුරු කර්මාන්ත වැනි සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත ව ඇති අමුද්‍රව්‍ය සහ වෙළෙඳපොළ ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දීම |
| **සමුපකාර ව්‍යාපාරය** | ග්‍රාමීය ආර්ථික අවශ්‍යතා සපුරාලමින් නිෂ්පාදන ක්‍රියාවලියේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ශක්තිමත් දේශීය සමුපකාර ව්‍යාපාරයක් ඇති | සමුපකාර නිෂ්පාදන ක්‍රියාවලිය පුළුල් කිරීම<br><br>කාන්තා හා තරුණ සහභාගීත්වය පුළුල් කිරීම<br><br>නවීකරණය කිරීම<br><br>දේශපාලනයෙන් නිදහස්ව ස්වාධීන කිරීම | • කෘෂිකර්මාන්තය, කිරි නිෂ්පාදන කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සුළු අපනයන භෝග වගාව වැනි ක්ෂේත්‍ර ආශ්‍රිතව පුළුල්ව පැතිරුණු දියුණු සහ ශක්තිමත් නිෂ්පාදන සමුපකාර ක්‍රමයක් ආරම්භ කිරීම<br>• නිෂ්පාදන සමුපකාර ක්‍රමය මගින් තරුණ සහ කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය කිරීම සඳහා අපනයනය පදනම් කරගත් වටිනාකම් එකතු කිරීමේ ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම<br>• සම්ප්‍රදායික කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය, ප්‍රාග්ධනය සහ වෙළෙඳපොළ හඳුන්වාදීමේ වගකීමත් නිෂ්පාදන සමුපකාරවලට පැවරීම<br>• ප්‍රාග්ධනය සැපයීම සඳහා සියළු සමුපකාර සමිතිවල දායකත්ව ලබා ගනිමින් "සමුපකාර සංවර්ධන බැංකුවක්" ස්ථාපිත කිරීම<br>• රට පුරා ඇති සමුපකාර අලෙවිසැල් සම්පූර්ණයෙන් නවීකරණය කිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා |

| අංශය | ප්‍රතිපත්ති | උපායමාර්ග | ක්‍රියාමාර්ග |
|---|---|---|---|
| | කිරීම | | දීම<br>• පරිගණක දත්ත පද්ධතියක් ගොඩනැංවීම, තොරතුරු තාක්ෂණය හා අනෙකුත් නවීන තාක්ෂණික භාවිතයන් දිරි ගැන්වීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් හඳුන්වා දීම<br>• සමුපකාර සේවකයින්ගේ වැටුප් ක්‍රමය සංශෝධනය කොට වැටුප් ඉහළ නැංවීමට කටයුතු කිරීම<br>• පළාත් සභාවල එකඟත්වය මත සමුපකාර ප්‍රඥප්තිය සාධනීය ලෙස සංශෝධනය කර ව්‍යාපාර කටයුතුවලට අවශ්‍ය නිදහස ලබා දීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **තාක්ෂණය හා නව නිපැයුම්** | තාක්ෂණය මත පදනම්වන සමාජයක් ස්ථාපිත කිරීම (සුහුරු ජාතියක්) | ලංකාව නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම | අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘත්‍රිම බුද්ධිය, ජෛව තාක්ෂණය, රොබෝ තාක්ෂණය, ඔග්මන්ටඩ් රියලිටි, ක්ලවුඩ් කම්පියුටින්, නැනෝ තාක්ෂණය සහ ත්‍රිමාණ මුද්‍රණය වැනි නවීන තාක්ෂණයන් භාවිතය උපරිම තලයට ගෙන ඒම තුලින් ලංකාව නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම |
| | | ජනතාවගේ පහසුව පිණිස ජනතා කේන්ද්‍රීය ඩිජිටල් රාජ්‍යය තන්ත්‍රයක් බිහි කිරීම | • නව තාක්ෂණය අනුගත කිරීම තුලින් රාජ්‍ය යාන්ත්‍රණයේ පවතින අකාර්යක්ෂම බව හා ප්‍රමාදය වලක්වා ගැනීම පිණිස අන්තර්ජාලය හරහා සේවා සැපයීම<br>• තාක්ෂණය හා අන්තර්ජාලය භාවිතයෙන් ජනතා සේවාවන් සැපයීමේ(හැඳුනුම්පත්, ඔප්පු වැනි) මධ්‍යස්ථාන 9ක් පළාත් 9හි 1බැගින් ඇති කිරීම<br>• රථවාහන දඩ සඳහා දඩ මුදල් ගෙවීමට ඉලෙක්ට්‍රොනික ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම රාජ්‍ය අංශ මිලදී ගැනීම් දූෂණයෙන් තොරව හා විනිවිද භාවයෙන් යුක්තව ඉටු කිරීම සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයක් ඇති කිරීම |
| | | ඩිජිටල්කරණය වූ ලංකාවක් බිහි කිරීම | • අධිවේගී ෆයිබර් ඔප්ටික්ස් දත්ත හුවමාරු පද්ධතියක් සහ අධිවේගී ජංගම 5G Broadband ජාල පද්ධතියක් ස්ථාපනය කිරීම<br>• ඩිජිටල් පරිපාලන හා මෙහෙයුම් ක්‍රම ඇතුළත් ඩිජිටල් නගර ඇති කිරීම<br>• ඩිජිටල් ගෙවීම් කටයුතු සඳහා භෞතික සම්පත් හා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම<br>• දේශාන්තර විද්‍යුත් වාණිජ්‍යය සහ ජාත්‍යාන්තර විද්‍යුත් ගේවීම් ක්‍රම ස්ථාපනය<br>• දත්ත ආරක්ෂණ, සයිබර් ආරක්ෂාව බුද්ධිමය දේපල අයිතිය සඳහා නව නීති රෙගුලාසි සකස් කිරීම |
| | | තොරතුරු තාක්ෂණ ව්‍යාවසායකත්වයක් බිහිකිරීම | • 2025 වනවිට Business Process Outsourcing (BPO) සහ Knowledge Process outsourcing (KPO) සේවාවන් ඇ.ඩො. බිලියන 3ක අපනයන වටිනාකමකින් යුත් සේවාවක් දක්වා වර්ධනය |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | • Process Outsourcing (BPO) සහ Knowledge Process outsourcing (KPO) සේවා මධ්‍යස්ථාන ස්ථාපනය<br>• මෘදුකාංග ඉංජිනේරුවන්ගේ සහ වැඩසටහන් සම්පාදකයන්ගේ සංඛ්‍යාව 2025වන විට ලක්ෂ 3 දක්වා වැඩි කිරීම<br>• රට තුලම දේශීය මෘදුකාංග නිපදවීමට අනුග්‍රහය දැක්වීම<br>• ජාත්‍යන්තර වෙළඳපොළට ගැලපෙන මෘදුකාංග සකස් කිරීම සඳහා ව්‍යවසායකයින් දිරි ගැන්වීම |

# 07 පරිච්ඡේදය

## භෞතික අවකාශ භාවිතයේ නව ප්‍රවේශය

**"ජීවන අංශවලට සමානව සේවා හා යටිතල පහසුකම් සැපයීමෙන් නාගරික හා ග්‍රාමීය පරතරය පියවීම"**

- නාගරීකරණයේ විෂමතා විසඳීම සඳහා ඒකාබද්ධ භෞතික අවකාශීය පද්ධතිය
- කෘෂි කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සහ අගය එකතු කළ නිෂ්පාදන ක්‍රියාවලිය සහතික කිරීම සඳහා සියලුම ප්‍රධාන නගර, නගර, ව්‍යාපාරික කලාප ඒකාබද්ධ කිරීම.
- සියලුම ව්‍යාපාරික කලාප ඒකාබද්ධ කරමින් ප්‍රධාන වරායන් හා ගුවන් තොටුපළවල් දෙකක් සම්බන්ධ කරන 'සී හැඩැති ආර්ථික කොරිඩෝ' පද්ධතියක් ඇති කිරීම.
- කාර්යක්ෂම හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහන පද්ධතියක් සඳහා ප්‍රවාහන ජාලය සංවර්ධනය කිරීම
- ජාත්‍යන්තර ගුවන්තොටුපල සහ වරාය වාණිජ හා මගී වරායන් බවට පරිවර්තනය කිරීම
- අඩු වියදම් බලශක්තිය සඳහා ප්‍රවේශය වැඩි කිරීම
- රටේ සමස්ත ජනගහනය සහතික කිරීම සඳහා පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය ලබා දෙන අතරම නල ජලය සඳහා ඇති ප්‍රවේශය වැඩි කිරීම
- ආපදාවන්ගෙන් ජීවිත,දේපළ හා ආර්ථික හානිය අවම කිරීම සඳහා වැලැක්වීමේ පියවර සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහතික කිරීම

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **නාගරික ප්‍රතිව්‍යුහගතකරණය** | ඒකාබද්ධ භෞතික අවකාශ භාවිතය මගින් නාගරීකරණ ක්‍රියාවලියේ විෂමතා තුරන් කිරීම හා නගර ව්‍යුහාත්මක වෙනසකට බඳුන් කිරීම | භූගෝලීය , ඓතිහාසික, ආර්ථික හා සමාජයීය වටිනාකමත් හා යෝජිත C කලාපය සම්බන්ධීකරණයේදී ඇති වැදගත්කමත් සලකා විවිධ ස්ථරවලට අයත් නගර පද්ධතියක් ස්ථාපිත කිරීම තුළින් නාගරීකරණ ක්‍රියාවලියේ විෂමතා තුරන් කිරීම | • කොළඹ, හම්බන්තොට, යාපනය සහ ත්‍රිකුණාමලය යන නගර සිව්මහ බහුවිධ වාණිජ නගර ජාතික සහ ජාත්‍යන්තර මධ්‍යස්ථාන සමග සම්බන්ධ වන පරිදි සංවර්ධනය කිරීම<br>• මහනුවර, අනුරාධපුරය, ගම්පහ, රත්නපුරය, ගාල්ල, බදුල්ල, මන්නාරම, මඩකලපුව සහ කුරුණෑගල යන නගර ජාතික නගර ලෙස සංවර්ධනය කිරීම<br>• පුත්තලම, මීගමුව, පොතුවිල්, දඹුල්ල, මාතර, නුවර එළිය සහ බුත්තල යන නගර සහසම්බන්ධිත නගර ලෙස සංවර්ධනය කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
| --- | --- | --- | --- |
| | | තොරතුරු තාක්ෂණය, දැනුම හා සංචාරක සේවා තුළින් නාගරික සුවපහසු ජීවන මධ්‍යස්ථාන නිර්මාණය කිරීම. | • තොරතුරු තාක්ෂණය, දැනුම හා සංචාරක සේවා යන අංශවල දායකත්වයෙන් පොකුරු නගර සංවර්ධනය කිරීම. |
| **අළුත් කොළඹ - වෙළඳ සහ මූල්‍ය පුරවරය** | 21 වන සියවසේ "අළුත් කොළඹ" | කොළඹ නගරය ගෝලීය වාණිජ, වෙළඳ හා මූල්‍ය මධ්‍යස්ථානයක් බවට පත් කිරීම | • කොළඹ නගරය ජාත්‍යන්තර වාණිජ, වෙළඳ හා මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය සහ මූල්‍යමය විධිවිධාන හඳුන්වා දීම |
| | | මාර්ග තදබදය ලිහිල් කිරීමටත්, දෛනික ගමනාගමනය පහසු කිරීමටත් නවීන අධිවේගී ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීම | • කොළඹ නගරය ආශ්‍රිත උපනාගරික ප්‍රදේශ මෙන් ම වරාය නගරය ද සම්බන්ධ කරමින් නාගරික දුම්රිය පද්ධතියක් ස්ථාපනය කිරීම<br>• තදබදය ලිහිල් කිරීම හා දෛනික ගමනාගමනය පහසු කිරීම සඳහා සැහැල්ලු දුම්රිය මාර්ග පද්ධතියක් ගොඩනැගීම<br>• තනි අතට දිවෙන වටරවුම් මාර්ග ධාවන සැලැස්මක් ක්‍රියාත්මක කරන අතර ම ප්‍රධාන මංසන්ධිවල ඇතිවන වාහන තදබදය අවම කිරීම සඳහා ගුවන් පාලම් පද්ධතියක් නිර්මාණය කිරීම හා සෑම ප්‍රධාන නගරයක ම යාන්ත්‍රික සිරස් වාහන අංගන පිහිටුවීම |
| | | කොළඹ නගරය අලංකරණය කිරීම | • නාගරික වන උයන්, ජල උද්‍යාන හා මාර්ග දෙපස හරිත මංතීරු හඳුන්වා දීම<br>• නාගරික අපද්‍රව්‍ය සහ මලාපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් හඳුන්වා දීම සහ ජලය ප්‍රතිචක්‍රීකරණය සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම |
| **ගොඩබිම් ප්‍රවාහනය** | ආර්ථික වර්ධනය සහතික කරමින් සාමාන්‍ය ජනතාවට සුවපහසු, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක් | මාර්ග ජාලය සංවර්ධනය කිරීම | • අදාළ ආර්ථික කොරිඩෝ සම්බන්ධ කරමින් සංවර්ධනය නොකළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම<br>• තව දුරටත් ප්‍රමාද නොවී කොළඹ-මහනුවර, වරාය පිවිසුම් උස් අධිවේගී මාර්ගය, උතුරු අධිවේගී මාර්ගය, රත්නපුර අධිවේගී මාර්ගය, නව කැලණි පාලම සිට අතුරුගිරිය අධිවේගී මාර්ගය සම්පූර්ණ කිරීම.<br>• මහනුවර සහ නුවරඑළිය අතර උස් අධිවේගී මාර්ගයක් ඉදිකිරීම සඳහා ශක්‍යතා |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | සැපයීම සඳහා මාර්ග හා දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් | | අධ්‍යයනයක් කිරීම<br>• ඉස්සර කිරීමේ මං තීරු හඳුන්වා දීමෙන් රථවාහන බාධක ඉවත් කිරීම<br>• ග්‍රාමීය මාර්ග ජාලය නැවත සකස් කිරීම හා නවීකරණය කිරීම<br>• ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග සඳහා ඉහළ මට්ටමේ ප්‍රවේශයක් සඳහා විකල්ප මාර්ග පද්ධතියක් සකස් කිරීම |
| | | මාර්ග ප්‍රවාහනය සංවර්ධනය කිරීම | • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) නවීකරණය කිරීම<br>• ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අමතර ආදායමක් උපයා ගැනීම සඳහා ප්‍රධාන ඉඩම්වල පිහිටි බස් නැවතුම් පොළවල් වාණිජමය ලෙස සංවර්ධනය කිරීම.<br>• වත්මන් බස් සංචිතය ප්‍රතිස්ථාපනය කර නව කොළඹ නගර සීමාව තුළ ධාවනය කිරීම සඳහා පරිසර හිතකාමී (හරිත ප්‍රවාහන) බස් රථ හඳුන්වා දීම.<br>• 'පාර්ක් ඇන්ඩ් රයිඩ්' ක්‍රමය හඳුන්වා දීම<br>• බැංකු ණය, බදු සහන ආදී සහන ලබා දී ලාභදායී ලෙස ධාවනය කිරීම මඟින් මහජනයාට වඩා හොඳ සේවාවක් සැපයීම උදෙසා පුද්ගලික බස්රථ ක්‍රියාකරුවන්ට සහාය වීම<br>• රාජ්‍ය හා පෞද්ගලික මගී ප්‍රවාහනය සඳහා පොදු කාලසටහනක් හඳුන්වා දීම<br>• පුද්ගලික මගී ප්‍රවාහන බස්රථ ක්‍රියාකරුවන්ට බස් රථ ඇණිය ප්‍රතිස්ථාපනය කිරීමට සහ හරිත ප්‍රවාහනයට අනුකූල වීමට සහාය වීම<br>• රාජ්‍ය හා පෞද්ගලික ප්‍රවාහන සේවා සඳහා පොදු තනි ප්‍රවාහන ඊ-ටිකට් ක්‍රමයක් හඳුන්වා දීම<br>• විනයගරුක, විශ්වසනීය හා පිරිසිදු පොදු ප්‍රවාහන සේවාවක් සහතික කිරීම සඳහා සියලුම රාජ්‍ය හා පෞද්ගලික බස් රථ හිමියන්ගේ පුහුණුව හා නිපුණතා සංවර්ධනය<br>• වර්තමාන රථවාහන දඩ ක්‍රමය සංශෝධනය කිරීම සහ නැවත විමසා බැලීම සහ පෞද්ගලික බස්රථ ක්‍රියාකරුවන් විනයගරුක, රථවාහන නීතිවලට තදින් අවනත වන සහ අනෙකුත් මහජන ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වන යාන්ත්‍රණයක් ස්ථාපිත |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | කිරීම |
| | | දුම්රිය ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම | • නිසි අන්තර්- ප්‍රවාහන මාධ්‍ය සම්බන්ධතාවය සහතික කිරීම සඳහා දුම්රිය සේවා සමඟ ඒකාබද්ධ වූ බස් ධාවන මාර්ග සංවර්ධනය කිරීම<br>• පවතින දුම්රිය එන්ජින් සහ මැදිරි සංවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම<br>• පවත්නා දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීම<br>• වේයන්ගොඩ -කොළඹ- පානදුර, රාගම-කටුනායක- මීගමුව සහ මරදාන-හෝමාගම දුම්රිය මාර්ග විද්‍යුත්කරණය කිරීම<br>• ඊ-ටිකට්පත් ක්‍රමයක් හඳුන්වා දීම<br>• අවශ්‍ය යටිතල පහසුකම් සහ දුම්රිය එන්ජින් සහ මැදිරි පහසුකම් සැපයීම මගින් දුම්රිය පදනම් කරගත් භාණ්ඩ ප්‍රවාහනය ප්‍රවර්ධනය කිරීම හා පුළුල් කිරීම<br>• භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය දුම්රිය එන්ජින් ආනයනය කිරීමට සහ දේශීයව ට්‍රේලර් තැනීමට සහාය ලබා දීම<br>• කොළඹ, හම්බන්තොට, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමල වරායන් වෙත දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම හා පුළුල් කිරීම.<br>• ප්‍රධාන දුම්රිය ස්ථාන ආශ්‍රිතව වාණිජමය වශයෙන් ශක්‍යතාවක් ඇති වෙළඳ සැල් සහ සාප්පු ස්ථාපිත කිරීම. |
| | | ඇල මාර්ග ඔස්සේ ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම | • නව ප්‍රවාහන ක්‍රමයක් ලෙස ඇල මාර්ග ඔස්සේ ප්‍රවාහනය වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම |
| මුහුදු ප්‍රවාහනය | අනෙකුත් කලාපීය වරායන් සමඟ තරඟකාරී ලෙස ඉහළ කාර්යක්ෂමතාවයක් සහතික කරමින් | කොළඹ වරාය සංවර්ධනය | • කොළඹ සහ හම්බන්තොට මුහුදු වරායන් වාණිජ හා මගී වරායන් ලෙස සංවර්ධනය කිරීම හා නිදහස් වරායන් බවට පරිවර්තනය කිරීම<br>• ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීමේ ධාරිතාව දෙගුණ කිරීම සඳහා කොළඹ වරාය වැඩි දියුණු කිරීම<br>• නැගෙනහිර බහාලුම් පර්යන්තය (ECT) සංවර්ධනය කිරීමට ප්‍රමුඛත්වය ලබාදීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | ආනයන හා අපනයන පහසුකම් සැපයීම සඳහා වරාය සංවර්ධනය කිරීම | | • ECT සහ SAGT අතර නව හරස් නැංගුරම් පොලක් ඉදිකිරීමේ ශක්‍යතා අධ්‍යයනය<br>• පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් බටහිර බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම<br>• බහාලුම් ප්‍රවාහනය සඳහා දුම්රිය ප්‍රවාහනය භාවිතා කිරීම<br>• පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් පෑලියගොඩ, වේයන්ගොඩ සහ රත්මලාන යන ප්‍රදේශවල මාර්ග හා දුම්රිය සහසම්බන්ධතාව පදනම් කරගත් බහාලුම් අංගන තුනක් සංවර්ධනය කිරීම |
| | | හම්බන්තොට වරාය සංවර්ධනය | • ශ්‍රී ලංකාව සහ චීනය යන රටවල් දෙකටම වඩා වාසිදායක වන තත්වයක් ඇති කර ගත හැකි ලෙස අත්සන් කරන ලද ගිවිසුම් නැවත සමාලෝචනය කිරීම<br>• කාර්මික හා සේවා වරායක් ලෙස සංවර්ධනය කිරීම සහ නැව් නඩත්තු කිරීම, අළුත්වැඩියා කිරීම සහ නැව් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම වැනි සේවාවන් සැපයීම සඳහා දේශීය ව්‍යාපාර සඳහා පහසුකම් ඇති කිරීම<br>• හම්බන්තොට නිදහස් වෙළඳ කලාපයට අවශ්‍ය සියලු භෞතික යටිතල පහසුකම් සැපයීම |
| | | වෙනත් වරායන් සංවර්ධනය කිරීම | • එක් එක් කලාපයේ අවශ්‍යතාවයන් සහ ජාතික ආර්ථිකයේ අවශ්‍යතා අනුව ගාල්ල, කන්කසන්තුරෙයි සහ ත්‍රිකුණාමලය වරායන් සංවර්ධනය කිරීම |
| **ගුවන් ප්‍රවාහනය** | දේශීය හා ජාත්‍යන්තර මගී හා භාණ්ඩ ප්‍රවාහනය ට පහසුකම් සැලසීම සඳහා ගුවන්තොටුපල සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ගුවන්තොටුපල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | • කටුනායක ගුවන් තොටුපලේ දෙවන ධාවන පථය සහ මගී පර්යන්තය සංවර්ධනය කිරීම<br>• කටුනායක ගුවන් තොටුපලේ අභ්‍යන්තර ගුවන් මගී පර්යන්තයක් සංවර්ධනය කිරීම<br>• මත්තල ගුවන් තොටුපලේ වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම<br>• මත්තල ගුවන් තොටුපලේ පහසුකම් වැඩි දියුණු කිරීම<br>• නුවරඑලිය ගුවන් තොටුපල ඇතුළු අභ්‍යාන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **විදුලි බල හා බලශක්ති** | ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය වන අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම | පවතින බලශක්ති මිශ්‍රණය වැඩි දියුණු කිරීම | • 2030 වන විට සමස්ත බලශක්ති මිශ්‍රණයෙන් සියයට 80 ක් සඳහා ජල හා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය වැඩි දියුණු කිරීම<br>• බලශක්ති සුරක්ෂිතතාවය සහ ස්වයංපෝෂිතභාවය සහතික කිරීම<br>• ස්වාභාවික වායුව ගවේෂණය කිරීම කඩිනම් කිරීම<br>• කොලොන්නාව තෙල් පිරිපහදුව නවීකරණය කිරීම<br>• ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම<br>• 2020 වන විට බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය, 2021 වන විට උමා ඔය, 2023 වන විට මොරගොල්ල හා 2024 වන විට තලපිටිගල සහ සීතාවක ජාතික විදුලිබල පද්ධතියට මෙගාවොට් 230 ක විදුලි බලයක් එක් කිරීම<br>• කැලණිතිස්ස බලාගාරය ස්වාභාවික වායු ටර්බයින බලාගාරයක් බවට පරිවර්තනය කරන අතර 2023 ට පෙර කෙරවලපිටිය හා හම්බන්තොට යන ප්‍රදේශවල මේ හා සමාන බලාගාර දෙකක් ක්‍රියාත්මක කිරීම<br>• කොළඹ ප්‍රදේශයේ ඇති සියලුම ඉන්ධන බලාගාර ස්වාභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම<br>• ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාව සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම |
| | | පුනර්ජනනීය බලශක්තිය සඳහා රටේ බලශක්ති මිශ්‍රණය පරිවර්තනය කිරීම | • 2021 වන විට මන්නාරම සුළං බලාගාරය මඟින් බලශක්තිය මෙගාවොට් 100 ක් සහ මන්නාරම, පූනරීන් සහ මොණරාගල ප්‍රදේශවල සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙගාවොට් 800 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම<br>• ගෘහ කුටුම්භ හා කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම් බලශක්තිය ලබා ගැනීම සහතික කිරීම සඳහා වහල මත සවි කරන ලද සූර්යකෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම<br>• පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයින් දිරිමත් කිරීම<br>• කාර්මික අපද්‍රව්‍ය උපයෝගී කරගනිමින් කාර්යක්ෂම බලශක්ති උත්පාදනය දිරිමත් කිරීම<br>• නව ප්‍රතිපත්ති හා නීති සම්පාදනය කිරීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බලශක්ති භාවිතය |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | උපරිම කිරීම |
| ජලය | සෑමට ජලය සහතික කිරීම | ජල සම්පත් අපවිත්‍ර වීම හෝ ජල දූෂණයෙන් තොර බවට සහතික වීම හා පානීය හා කෘෂිකර්මික කටයුතු සඳහා ජල සම්පත් කාර්යක්ෂමව කළමණාකරණය කිරීම. | • ජල සම්පත් පිරිසිදුව තබා ගැනීම පිළිබඳ විශ්ව විද්‍යාල සිසුන්, පාසල් ළමුන් සහ තරුණයින්ගේ සහය ඇතිව ජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් කිරීම.<br>• තවදුරටත් මෙම දැනුවත් කිරීමේ ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යාම සඳහා ප්‍රාදේශීය පොලිසිය සහ ප්‍රදේශයේ ප්‍රජාවන් සම්බන්ධ කර ගැනීම.<br>• කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම හා බිංදු ජල තාක්ෂණික ක්‍රම (drip irrigation) භාවිතා කිරීම ධෛර්යමත් කිරීම.<br>• මේ සඳහා, අඩු පොලි ණය සහ බදු සහන හඳුන්වා දීම.<br>• රසායනික ද්‍රව්‍ය, පළිබෝධනාශක සහ වෙනත් හානිකර රසායනික ද්‍රව්‍ය වලින් ගංගා, වැව් හා ජලාශ ආරක්ෂා කිරීම.<br>• දැනට පවත්නා වැව් හා ජලාශ වල ධාරිතාවය පුළුල් කිරීම හා නව වැව් හා ජලාශ ඉදි කිරීම මඟින් ජල ගබඩා ධාරිතාවය වැඩි කිරීම.<br>• භූගත ජලය නැවත ආරෝපණය (recharge) කිරීම සහ භූගත ජලය අනිසි ලෙස භාවිතා කිරීම අවම කිරීම සඳහා ජල හිඟ ප්‍රදේශවල පිහිටි සියලුම නව නිවාස සඳහා ජලය ගබඩා කිරීමේ යාන්ත්‍රණයක් හඳුන්වා දීම. |
| | | ගංවතුර පාලන පද්ධති සහ නියං කළමනාකරණ හැකියාව ශක්තිමත් කිරීම. | • ජලය පොම්ප කිරීමේ ක්‍රම සහ ජලය ගබඩා කිරීමෙන් ගංවතුර පාලන යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම.<br>• ජල කාණු හා ඇළ මාර්ග පද්ධති හරහා ජලය වියළි ප්‍රදේශවලට හරවා යැවීම.<br>• මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂඥ දැනුමෙන් යුත් පුද්ගලයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම. |
| | | පැය 24 පුරා විශ්වාසදායක ජල සැපයුමක් සහතික කිරීම. | • ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන හා ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති පුළුල් කිරීම හා එම ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම.<br>• සියලුම කාර්මික හා වාණිජ ඉදිකිරීම් සඳහා සුදුසු ජල ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා නව නිති හඳුන්වා දීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **ආපදා කළමනාකරණය** | ජීවිත හා දේපල ආපදාවන්ගෙන් ආරක්ෂා කිරීම සහ ආර්ථිකමය හානි වැළැක්වීම | ඒකාබද්ධව මනා සම්බන්ධීකරණයකින් යුතුව ආපදා කළමනාකරණ අභ්‍යන්තර ආයතන පද්ධතිය ක්‍රියා කරවීමට කටයුතු සැලසීම | • සියළුම ආකාරයේ ආපදාවන් කළමනාකරණය කිරීමට හැකිවන පරිදි ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම |
| | | ආපදා පෙර දැනුම් දීමේ පද්ධතිය ශක්තිමත් කිරීම | • ආපදා තත්ත්වයන් පිළිබඳව නිවැරදිව පුරෝකථනය කළ හැකි වන පරිදි නවීන උපකරණ, තාක්ෂණය සහ දැනුමින් කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුව සන්නද්ධ කිරීම |
| | | ආපදා තත්ත්වයකදී කඩිනමින් හා වගකීමෙන් කටයුතු කිරීම සඳහා අදාළ ආයතන සවිබල ගැන්වීම | • ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා අවශ්‍ය පහසුකම් හා නීතිමය බලතල ලබා දීම<br>• ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ආපදා සහන සේවා මධ්‍යස්ථානය ඒකාබද්ධ කර ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවතින “ආපදා කළමනාකරණ අධිකාරියක්” ස්ථාපිත කිරීම |
| | | සැලසුම් කිරීම සහ නිවැරදි තීරණ ගැනීම සඳහා දත්ත උපයෝජ්‍යතාව තහවුරු කිරීම | • ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ, නිතර ආපදාවන්ට ලක් වීමේ අවදානමක් සහිත ප්‍රදේශ, ආපදාවන්ට ලක් වූ පුද්ගලයන්, දේපල, ව්‍යාපාර සහ කෘෂිකාර්මික ඉඩම් ආදී සියළු තොරතුරු ඇතුළත් "ජාතික ආපදා දත්ත ගබඩාවක්" ස්ථාපනය කිරීම |
| | | ආපදාවන්ට ලක්වූ පුද්ගලයින් හා දේපල සඳහා නියමිත වන්දි ලබා දීම තහවුරු කිරීම | • උමා ඔය වැනි ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයින්, නිවාස හා අනෙකුත් දේපල, ඉඩම් සහ කෘෂිකාර්මික ඉඩම් සඳහා නිසි තක්සේරුවක් සිදු කොට කඩිනමින් වන්දි ලබා දීම |
| | | කාන්තාවන් සහ ළමුන් වැනි ආපදාවන්ට පහසුවෙන් ගොදුරු වීමේ අවදානමක් සහගත පුද්ගලයින්ගේ ආරක්ෂාව තහවුරු කිරීම | • නිතර ආපදා අවදානමට ලක්වන පුද්ගලයින්ට, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ට රැකවරණය හා පහසුකම් සැලසීමටත්, දුෂ්කරතා අවම කිරීමටත් ස්ථිර “රැකවරණ මධ්‍යස්ථාන” ස්ථාපිත කිරීම<br>• ආපදා තත්ත්වයන්ගෙන් තොර කාලවලදී යෝජිත රැකවරණ මධ්‍යස්ථාන තාවකාලිකව කුලියට ලබාදීම මඟින් එම මධ්‍යස්ථාන නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වියදම් උපයා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
| --- | --- | --- | --- |
| | | අලි-මිනිස් ගැටුම අවම කිරීම | • වඩා ශක්තිමත් අලි වැට පද්ධතියක් ස්ථාපනය කිරීම<br>• වනසතුන්ට අවශ්‍ය ආහාර, ජල ප්‍රභවයන් සුරැකෙන පරිදි රක්ෂිත ප්‍රදේශවල ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීම හා අලිමංකඩවල ඇති බාධා ඉවත්කොට වන අලින්ගේ සංචරණය පහසු කිරීම<br>• අලි-මිනිස් ගැටුම හේතුවෙන් පීඩාවට ලක් වූ සියළුම පුද්ගලයින් සඳහා වන්දි ලබා දීම |

# 8 පරිච්ඡේදය

## තිරසාර පාරිසරික ප්‍රතිපත්තියක්

**"සමබර සමාජීය, ආර්ථික සහ පාරිසරික පුරුදු ක්‍රියාවට නැංවීම තුළින් තිරසාර සංවර්ධනයක් කරා ළඟා වීම"**

- **අප රටෙහි පරිසරය ආරක්ෂා කිරීමට, සංරක්ෂණය කිරීමට සහ ප්‍රතිස්ථාපනය කිරීමට ක්‍රියා කිරීම.**
- **දැනට පවතින සියලුම පාරිසරික ප්‍රතිපත්ති හා නීති යාවත්කාලීන කිරීම.**
- **රටෙහි සංවර්ධන ක්‍රියාදාමයන්හිදි හුදු ආර්ථික සංවර්ධනය පමණක් නොව තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කිරීම.**
- **පෞරාණික, දේශීය සහ සාම්ප්‍රදායික දැනුම, නවීන විද්‍යාව හා තාක්ෂණය සමඟ ගලපාගැනීම සහ භාවිතය නිරන්තරයෙන් ගවේෂණය කිරීම.**
- **ජනතාවගේ යහපැවැත්ම, සෞභාග්‍යය, ආර්ථික සංවර්ධනය සහතික කිරීම සඳහා තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති හා බැඳුනු ක්‍රියාමාර්ග, ප්‍රාදේශීය පරිපාලන ව්‍යුහය දක්වා සම්බන්ධීකරණය කිරීම.**

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **භූමිය** | රටෙහි භූමිය ජනතාවගේ පැවැත්ම, සඳහා ම මෙන්ම අනෙකුත් ජීවීන්ගේ සහ අනාගත පරපුර උදෙසා ද භූමිය භාවිතයට ගැනීම | ජාතික භෞතික සැලැස්ම (National Physical Plan) යාවත්කාලීන කිරීම | ▪ පරිසර විද්‍යානුකූලව සකසන ලද කෘෂිකර්මය, සත්ව පාලන සහ වැවිලි කර්මාන්ත ස්ථාපනය කිරීම |
| | | සෝදා පාලුව අවම කිරීම | ▪ හරිත ආවරණය නැවත ස්ථාපනය සහ දිරිගැන්වීම<br>▪ නවීන දියුණු තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම |
| | | සංවේදී පාරිසරික කලාප සංරක්ෂණය | ▪ වගුරු බිම් හා කඩොලාන පද්ධති විනාශ කරන මානව ක්‍රියාකාරකම් පාලනය කිරීම |
| | | සෝදා පාලුව සහ නිසරු වීම නිසා අතහැර දමා ඇති භූමි ප්‍රතිස්ථාපනය | ▪ සෝදාපාලු හා නිසරු බිම් හඳුනාගෙන, කෘෂි වන වගා සහ වන උද්‍යාන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **කසල කළමනාකරණය** | තිරසාර පරිභෝජන සංකල්ප | අපද්‍රව්‍ය නිශ්පාදනය අවම කිරීම, නැවත පරිභෝජනයට ගැනීම සහ ප්‍රතිචක්‍රීකරණය | ▪ පාරිසරික කර්මාන්ත කලාප ඇති කිරීම<br>▪ කසල නිෂ්පාදන සහ කසළ වෙන් කිරීම පිළිබඳ දැනුවත් බව ලබා දීම<br>▪ කුඩා කල සිට තිරසාර සංකල්ප සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරිම<br>▪ ගෘහස්ථ සහ කර්මාන්ත මට්ටමින් කසල වෙන් කිරීම අනිවාර්ය කිරීම |
| | | වෙරළාශ්‍රිත සහ සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීම | ▪ සමුද්‍ර ආශ්‍රීත පරිසර දූෂණය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වාදීම |
| | | කසල එකතු කිරීමේ සහ බැහැර කිරීමේ පද්ධතීන් ස්ථාපිත කිරීම | ▪ පළාත් පාලන ආයතන කිහිපයක් ඒකාබද්ධ වන පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමේ අංගන හා සනීපාරක්ෂක කසල රඳවනයන් ස්ථාපනය කොට අක්‍රමවත් කසල බැහැර කිරීම් වළක්වාලීමට කටයුතු සම්පාදනය කිරීම<br>▪ රෝහල් සහ කර්මාන්ත ශාලා අපද්‍රව්‍ය තාක්ෂණික සහ විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීමට අනුගත වන පරිදි  නීති ක්‍රමවේදයන් සකස් කිරීම |
| | | කසල බැහැර කිරීමට අදාළව නීතී රීති බලාත්මක කිරීම | ▪ වගකීම් රහිත කසල බැහැර කිරීම් වලට එරෙහිව දැඩි පියවර ගැනීම |
| **වායුගෝලය** | කාබන් ශුනය (Net-Zero) රටක් | කාබන් විමෝචනය ද ඇතුලුව විෂ වායුගෝලයට මුදාහැරීම පාලනය කිරිම | ▪ කර්මාන්තශාලා ආශ්‍රිතව රුක්වන වගා තීරු, නාගරික රුක්ගොමු, මහදෙපස රුක් රෝපණය, තුරු උයන් හා ගෘහාශ්‍රිත කෘෂි වන වගා දිරිගැන්වීම |
| | | කාබන්හරණය (de- carbonization) ක්‍රියාත්මක කිරීම | ▪ විදුලිය නිෂ්පාදනය සඳහා පොසිල ඉන්ධන භාවිතය සීමිත කිරීම සහ ප්‍රවාහනය, කර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීමේදී කාබන්හරණය දිරි ගැන්වීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **පරිසර සහ ජෛව විවිධත්වය** | ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම | ආයතනයන්හි පවතින අවහිරතා (institutional bottlenecks and red tapes) මඟ හැරවීම | ▪ දැනට පවතින පාරිසරික නීති රාමුවේ සංකීර්ණතාවයන් හා දුර්වලතා මගහරවාගැනීමට ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හා ප්‍රතිස්ථාපනය කිරීම එක් ආයතනයක් යටතේ ක්‍රියාත්මක කරවීම |
| | භූමිය සහ ජල සම්පත තිරසාර ලෙස කළමනාකරණය කිරීම | ජාතික වන ආවරණය 30% දක්වා වර්ධනය කිරීම | ▪ නැවත වන වගා කිරීම සඳහා සුදුසු භූමිය හඳුනාගැනීම<br>▪ නාගරික හා අර්ධ නාගරික උද්‍යාන ස්ථාපිත කිරීම<br>▪ අධිවේගී මාර්ග දෙපස රුක් රෝපණ තීරු ස්ථාපිත කිරීම මඟින් නාගරික වන වගා සංවර්ධනය කිරීම<br>▪ කර්මාන්ත ගොඩනැගිලි ආශ්‍රිතව වන වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම<br>▪ ඛාදනයට සහ ක්ෂය වීමට භාජනය වූ පාරිසරික පද්ධතීන් නැවත පුනරුත්ථාපනය සහ ස්ථාපනය කිරීම |
| | | වැලි කැණීම් සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වාදීම | ▪ ගංගා ආශ්‍රිත හා භූමිය ආශ්‍රිත නිශ්චිත වැලි කැණීම් තීරු ස්ථාපනය කිරීම |
| | ජෛව විවිධත්වය රටෙහි ආර්ථික ප්‍රගමනය කරා | ජෛව විවිධත්ව සංකල්පය සංචාරක, අධ්‍යාපන සහ සංස්කෘතික අංගයන් සඳහා අන්තර්ග්‍රහනය කිරීම | ▪ රුදෙස් සංචාරක කර්මාන්තය (Eco tourism) සංවර්ධනය කිරීම<br>▪ ජෛව විවිධත්වය පාදක වූ අධ්‍යාපනය සහ සංස්කෘතික අංග දිරිමත් කිරීම<br>▪ පරිසර දූෂණය වැළැක්වීම සහ සංරක්ෂණය පාදක කර ගනිමින්, පාරිසරික ව්‍යවසායකත්ව (Eco- entrepreneurship) දිරිගැන්වීමට අදාළව අභියෝග වලට මුහුණ දීම සඳහා ධනාත්මක ආකල්ප සහ දැනුවත් කිරීමේ අංග ඇතුළත්, සුදුසු ඉලක්කගත වැඩසටහන් පාසල් ළමුන්, තරුණයින් සහ ප්‍රජාව මූලික කර ගනිමින් සංවර්ධනය කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **සමුද්‍රීය සම්පත්** | නීලහරිත ආර්ථිකයක් | තිරසාර සමුද්‍රීය සම්පත් කළමනාකරණය | ▪ සමුද්‍ර විශ්ව විද්‍යාල අන්තර්ජාතික මට්ටමකරා රැගෙන යාම<br>▪ සාගර ගවේශනය සඳහා ප්‍රමුකත්වයක් ලබා දීම<br>▪ සමුද්‍ර ඛාදනය වැළැක්වීමට පියවර ගැනීම<br>▪ ඉදිකිරීම් කර්මාන්ත අංශය සඳහා අක්වෙරළ ආශ්‍රිත වැලි කැණීම් (onshore sand mining) දිරිමත් කිරීම<br>▪ සමුද්‍ර වැලි කැණීම් නිස්සාරණය සහ වෙන් කිරීම(purified and sieved) සඳහා තත්ත්ව සහතික නිකුත් කිරීම |
| **ජනාවාස සහ නගර** | හරිත සහ සුහුරු නගර සහ වාසස්ථාන | ඉඩම් හා බැඳුණු ඇඳුණු ආර්ථික සංකල්පයක් ඇති කිරීම | ▪ ජනාවාස ඉදිකිරීමේදී මූලිකවම පරිසරයට අවම බාධාවක් සිදුවන ආකාරයට ස්ථාන තෝරා ගැනීම<br>▪ දැනටමත් හඳුනාගෙන තිබෙන අවධානමට ලක්වී ඇති සංවේදී පරිසර කලාපවල කිසිදු ආකාරයක දැවැන්ත සංවර්ධනයක් සිදු නොකිරීමට පියවර ගැනීම<br>▪ දිර්ඝකාලීන සැලැස්මකට අනුව එක් එක් දිස්ත්‍රික්ක සඳහා උපාය මාර්ගික පාරිසරික විශ්ලේෂණයක් (SEA- Strategic Environmental Assessment ) සිදු කිරිම<br>▪ ජනාවාස ඉදිකිරීමේදී අසල්වාසී මූලධර්ම (Neighborhood principle) හා ඉහළට නැගෙන හරිත සංවර්ධනය (Vertical Green Development) යන සංකල්පයන්ට යටත්ව සිදු කිරිම |
| | | ස්වභාවික ව්‍යසනයන්ට ඔරොත්තුදෙන ජනාවාස දිරිමත් කිරිම | ▪ ස්වභාවික ව්‍යසනයන්ට අනුගත වන පරිදි ග්‍රාමීය යටිතල පහසුකම් හා සේවාවන් සංවර්ධනය හා ඒකාබද්ධ කිරීම |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **පාරිසරික අධ්‍යාපනය** | පාරිසරික සංවේදී ජනතාවක් නිර්මාණය කිරීම | අධ්‍යාපන පද්ධතිය තුලට පාරිසරික අධ්‍යාපනය අන්තර්ග්‍රහණය කිරීම | ▪ පළමු ශ්‍රේණියේ සිට පාරිසරික අධ්‍යාපන අංග පාසල් විෂය ධාරාවට ඇතුළත් කිරීම<br>▪ ආකල්ප සංවර්ධනය හා දැනුවත් කිරීම් දිරිගැන්වීම<br>▪ ව්‍යවසායකත්වය පදනම් කරගත් ආර්ථික ව්‍යුහයන් කරා නොබියව ගමන් කිරීම සඳහා කුඩා ළමුන්ගේ මනස සහ තරුණ මනස හැඩගැසීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම<br>▪ පාරිසරික නියාමනය පිළිබඳව දැනට පවතින සංකීර්ණතා දුරුකොට ඒ සඳහා සරල සහ පැහැදිලි කේන්ද්‍රීය යාන්ත්‍රණයක් හඳුන්වාදීම |

- ආගම දහමට ප්‍රමුඛස්ථානය.
- සමාජ සාධාරණත්වය උදෙසා නිතීය ක්‍රියාත්මක කිරීම.
- අනාගත පරපුර සඳහා ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ජාතික උරුමයන් මනා ලෙස සංරක්ෂණය කිරීම.
- බාධා විරහිතව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවස්ථාව සැලසීම.
- සමාජ අසමානතාවය අවම කිරීම සහ අසරණභාවයට සහ අනාරක්ෂිත තත්ත්වයට පත්ව ඇති ජනතාව ආරක්ෂා කිරීම රජයේ වගකීමක් ලෙස සැලකීම .

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **ආගම** | සියලු ආගම්වල අයිතිවාසිකම් ආරක්ෂා කර දීම | | |
| | ආගම දහමට ප්‍රමුඛස්ථානය | සෑම පුරවැසියෙකුටම තමන්ගේ ආගම ඇදහීමේ අයිතිය සහතික කිරීම | • සෑම ආගමකම ලියාපදිංචි දහම් පාසල් වල අඩුපාඩු සම්පූර්ණ කිරිමට පළාත් සභා සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. |
| | | “සසුන් උදාව” ජාතික වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම. | • දුෂ්කර ප්‍රදේශවල පිහිටි විහාරස්ථාන වලට අවශ්‍ය සියලුම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. |
| | | | • ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ඉංග්‍රීසි භාෂා දැනුම, පරිගණක සහ තාක්ෂණික කුසලතා වර්ධනය කිරීම සඳහා නව අධ්‍යාපනික වැඩසටහනක් හඳුන්වාදීම.<br>• ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මාසික අනුග්‍රාහක දායකත්ව ක්‍රමයක් හඳුන්වාදීම. |
| | | “බුදු - පුත් මාපිය හරසර “ වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | ශාසනයට තම දරුවන් භාරදුන් දෙමාපියන්ට රාජ්‍ය ගෞරව දැක්වීම. |
| | | පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම | • පරිවේණාධිපති ස්වාමීන්වහන්සේලාගේ හා පිරිවෙන් සහ දහම් පාසල් |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම. | ගුරුවරුන්ගේ නොවිසඳී ඇති පත්වීම්, වැටුප් සහ දීමනා පිලිබඳ ගැටලු නිරාකරණය කිරීම. |
| **සමාජ සාධාරණත්වය උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීම.** | නීතිය ආරක්ෂා කිරීම | නීතිය ක්‍රියාත්මක කරන ආයතන මෙන්ම නිලධාරීන්ද, නීතියට යටත්වන පරිසරයක් නිර්මාණය කිරීම. | • රටේ නීතිය ජාත්‍යන්තර නීතිය සමඟ මනාව ගැලපීම සඳහා නීති ක්‍රියාපටිපාටි සහ අණපනත් සංශෝධනය කිරීම.<br>• සිවිල් ආරවුල් අධිකරණය දක්වා නොගොස් විසඳා ගැනීම සඳහා සමථ මණ්ඩල ක්‍රියාවලිය බල ගැන්වීම.<br>• නීතිය ක්‍රියාක්මක කිරීමේ පටිපාටි සහ යාන්ත්‍රණය පිලිබඳ අදාල පුද්ගලයන්ට පුහුණුව ලබා දීම.<br>• විනිශ්චයකාර තනතුරු සහ නීති ක්ෂේත්‍රයේ ඉහල තනතුරු සඳහා පත් කිරීමේ දී පාරදෘෂ්‍ය යාන්ත්‍රණයක් හඳුන්වාදීම. |
| | | අධිකරණ පද්ධතිය තුල ඇති ප්‍රමාද වීම් වලක්වා ගැනීම. | අධිකරණ පද්ධතිය සහ ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණය හඳුන්වාදීම. |
| | | නීති වෘත්තියේ අභිමානය පවත්වාගෙන යාම සඳහා නීතිඥවරුන්ට පහසුකම් සපයාදීම. | නීතිඥවරුන්ට අඛන්ඩ වෘත්තීය සංවර්ධනය ලබා ගැනීම සඳහා උසස් නීති අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීම.<br><br>ජනාධිපති නීතිඥයන් පත් කිරීම සඳහා විනිවිදභාවයෙන් යුතු සෘජු ක්‍රමවේදයක් හඳුන්වාදීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **ජනමාධ්‍ය** | විනිවිදභාවයෙන් යුතු ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම. | බාධා විරහිතව තොරතුරු, දැනුම හා මතවාද සන්නිවේදනයට අවකාශ ලබා දීම. | ජාතික හා ජාත්‍යන්තර නීති රෙගුලාසි වලට අනුගත වන පරිදි මාධ්‍ය ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.<br><br>ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන සඳහා සමාජ සංස්කෘතික වටිනාකම් සහ සමාජ සාරධර්ම පිලිබඳ රාමුව ඉක්මවා නොයන පරිදි අවබෝධාත්මකව කටයුතු කිරීම.<br><br>ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ජනමාධ්‍ය උසස් අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම.<br><br>උසස් අධ්‍යාපන ප්‍රමිතීන් සහතික කෙරෙන ජනමාධ්‍ය අධ්‍යාපයක් ඇති කීරිම සඳහා විද්වත් කමිටුවක් පත් කිරීම.<br><br>පුවත්පත් මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම.<br><br>ජනමාධ්‍යවේදීන් සඳහා නාගරික නිවාස සංකීර්ණයක් ගොඩනැංවීම සහ සහන වාහන ණය ක්‍රමයක් හඳුන්වාදීම.<br>මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීම සඳහා පළාත් මට්ටමින් ජනමාධය සංගම් පිහිටුවීම.<br><br>සමාජ මාධ්‍ය ඇතුලු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම සඳහා සමාජ අධ්‍යාපන වැඩසටහන් හඳුන්වාදීම. |
| | | ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව වාණිජ තරගකාරීත්වයේ පීඩනයෙන් තොරව පවත්වාගෙන යාම සඳහා පාර්ලිමේන්තුවට වග කියන කොමිෂන් සභාවක් ඇති කර ඒ යටතට පත් කිරීම. | |
| **ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ජාතික** | අනාගත පරපුරට උරුමකර දීම සඳහා ඉතිහාසය, පුරාවිද්‍යාව | කිසිදු පූජනීය ස්ථානයක ඓතිහාසික උරුමයන්ට හෝ පුරා විද්‍යාත්මක වටිනාකම් වලට හානි | සියලු ජාතික උරුමයන් උපරිම ලෙස ආරක්ෂා කිරීමට අවශ්‍ය නීති අණපනත් සංශෝධය කිරීම සහ ඒ සඳහා සම්බන්ධීකරණ වැඩසටහනක් ආරම්භ කිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **උරුමයන්.** | සහ ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම. | සිදු කිරීමට කිසිවෙකුට ඉඩ නොතැබීම. | මධ්‍යම සංස්කෘතික අරමුදල පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් කර එය ප්‍රතිව්‍යුහගත කිරීම සහ සියලු ආගම් වලට අයත් ඩිජිටල් පුරාවිද්‍යා විශ්වකෝෂයක් නිර්මාණය කිරීම.<br><br>ජාතික වටිනාකමක් සහිත ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම.<br><br>ජාතික උරුමයන් සහ පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳ වැරදි තොරතුරු සංචාරකයන් අතර ප්‍රචලිත වීම වැළැක්වීම සඳහා සංචාරක මඟපෙන්වන්නන් හට නිවැරදි දැනුම සහ තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ඇති කිරීම. |
| **සංස්කෘතිය, සාහිත්‍ය සහ කලාව** | නව කතා, කෙටි කතා සහ කාව්‍ය කෘති වැඩිදියුණු කිරීම සහ ඉහල ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාම. | නවකතා, කෙටිකතා, කාව්‍ය කෘති සහ ඒ ආශ්‍රිත නිර්මාණ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම | නවකතා, කෙටිකතා සහ කාව්‍ය කෘති නිර්මාණය, ප්‍රකාශනය සහ අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා නව වැඩපිළිවෙලක් ඇති කිරීම.<br><br>ලේඛක කර්තෘ භාග නිසිලෙස ගෙවීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් සැකසීම.<br><br>ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය යටතේ පවතින ග්‍රන්ථ ප්‍රකාශනාධාර ව්‍යාපෘතියේ ධාරිතාව වැඩි කිරීම සඳහා දැනට සපයන මූල්‍ය ප්‍රතිපාදන ඉහළ නැංවීම.<br><br>සිංහල භාෂාවෙන් ප්‍රකාශිත විශිෂ්ඨ නිර්මාණ සහ ශාස්ත්‍රීය ග්‍රන්ථ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරීමටත්, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශිත එබඳු ග්‍රන්ථ සිංහල භාෂාවට පරිවර්තනය කිරීමටත් විශේෂ ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ රට තුල ඇති සියලුම පුස්තකාල පද්ධති නවීන තාක්ෂණික පහසුකම් සහිතව ප්‍රතිසංවිධානය කිරීම.<br><br>විද්‍යුත් ග්‍රන්ථ පරිශීලනය සඳහා වන අවකාශ පුළුල් කිරීම.<br><br>ලේඛකයන්ට සහ ප්‍රකාශකයන්ට අවශ්‍ය කඩදාසි සහ මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීම සඳහා බදු සහන ලබාදීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **වේදිකා නාට්‍ය** | | වේදිකා නාට්‍ය සඳහා අවශ්‍ය නවීන තාක්ෂණික පහසුකම් සැපයීම. | අංග සම්පූර්ණ “නාට්‍ය නිකේතනයක්” ස්ථාපිත කිරීම සහ නිර්මාණ ශිල්පීන්ට එය පරිහරණය නොමිලයේ ලබා දීම.<br><br>රංග ශාලා  සඳහා අවශ්‍ය නවීන පහසුකම් සැපයීම.<br><br>සංස්කෘතික සටයුතු දෙපාර්තමේන්තුව යටතේ ඇති එදිරිවීර සරත්චන්ද්‍ර නාට්‍ය පාසල ප්‍රතිසංවර්ධනය කිරීම සහ විශිෂ්ඨ කෘති ප්‍රතිනිෂ්පාදනය සඳහා අවශ්‍ය මූල්‍යාධාර සැපයීම.<br><br>වේදිකා නාට්‍ය නිෂ්පාදකයන් සඳහා අවශ්‍ය බදු සහන සැපයීම. |
| **සිනමා කර්මාන්තය** | | සිනමා කර්මාන්තයේ පවතින ගැටළු අධ්‍යයනය කිරීම සඳහා විශේෂ කාර්යසාධන ඒකකයක් ස්ථාපිත කිරීම. | |
| | | | කලාත්මක ගුණයෙන් ඉහල චිත්‍රපට නිෂ්පාදන සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබා දීම.<br><br>අංග සම්පූර්ණ රසායනාගාර පහසුකම් සහිත චිත්‍රාගාරයක් ආරම්භ කිරීම.<br><br>නගරාශ්‍රිත මහල් නිවාස සංකීර්ණ සහ බහු කාර්ය වාණිජ මධ්‍යස්ථානවල සිනමා ශාලා ඉදිකිරීමට රාජ්‍ය අනුග්‍රහය ලබා දීම සහ සියලුම සිනමා ශාලා ඩිජිටල් තාක්ෂණික පහසුකම් සහිත සිනමා ශාලා බවට පත් කිරීම.<br><br>ජාතික චිත්‍රපට සංස්ථාව ප්‍රතිසංවර්ධනය කිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **සංගීතය** | | කර්තෘභාග හිමිකාරීත්වය සඳහා ඵලදායී යාන්ත්‍රණයක් හඳුන්වාදීම. | ගීත සහ සංගීත ක්ෂේත්‍රයේ කර්තෘ භාග හිමිකාරීත්වය සම්බන්ධව පවතින අර්බුදය විසඳීම සඳහා පිළිගත් ජාත්‍යන්තර සම්මුතීන්ට අනුව විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වාදීම.<br><br>කර්තෘ භාග මාස 6කට වරක් ගෙවීම අනිවාර්ය කිරීම.<br><br>දුරකතන සමාගම් වල වාණිජ ඉපැයීම් සඳහා ගීත නිර්මාණ භාවිතා කිරීමේදී, ගීත රචකයින්ට, සංගීතඥයින්ට සහ ගායකයින්ට දැනට ගෙවනු ලබන කර්තෘ භාගය 50% දක්වා ඉහල නැංවීම. |
| | | නවක නිර්මාණකරුවන්ට සංධ්වනි, සංගීත නාටක සහ ඔපේරා වැනි සම්භාව්‍ය නිර්මාණ සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහය ලබාදීම. | අංගසම්පූර්ණ ශ්‍රව්‍ය දෘශ්‍ය මැදිරි සහ ශබ්දාගාර ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශයට බදු සහන ලබා දීම.<br><br>සංගීත සංදර්ශණ සංවිධානය කිරීමේ දී දැනට අයකරන බදු අඩු කිරීම. |
| **නර්තනය** | | පාරම්පරික නර්තන සම්ප්‍රදාය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.<br><br>උඩරට, පහතරට සහ සබරගමු ආදී නර්තන සම්ප්‍රදායන් වලට අයත් නිර්මාණ අඛන්ඩව පවත්නාගෙන යාම සඳහා අවශ්‍ය රාජ්‍ය අනුග්‍රහ ලබාදීම. | පාරම්පරික සහ නූතන නර්තන ශිල්පී කර්මාන්තය සංචාරක කර්මාන්තය සමඟ ඒකාබද්ධ කිරීම.<br><br>පාරම්පරික නර්තන කලාවේ ප්‍රවර්ධන සඳහා විද්‍යුත් මාධ්‍ය සහ නවීන තාක්ෂණය යොදා ගැනීම. |
| **චිත්‍ර සහ මූර්ති නිර්මාණ අංශය** | | චිත්‍ර සහ මූර්ති නිර්මාණ ප්‍රදර්ශනය සහ අලෙවිය සඳහා අවශ්‍ය | අංග සම්පූර්ණ චිත්‍ර සහ මූර්ති ප්‍රදර්ශණ කලාගාරයක් ඉදිකිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | අවස්ථා ඇති කිරීම | අදාළ පහසුකම් සහිත නිත්‍ය කලාගාර පද්ධතියක් දිස්ත්‍රික් මට්ටමින් ඉදිකිරීම.<br><br>චිත්‍ර සහ මූර්ති අංශය සංචාරක අංශය සමඟ ඒකාබද්ධ කරන සම්බන්ධීකරණ වැඩසටහනක් ස්ථාපිත කිරීම.<br><br>චිත්‍ර සහ මූර්ති අංශයේ විශිෂ්ඨ නිර්මාණ සංරක්ෂණ සඳහා සංරක්ෂණාගාරයක් ස්ථාපනය කිරීම. |
| **ශාන්තිකර්ම සහ පාරම්පරික චාරිත්‍ර ක්‍රම** | | සංස්කෘතික අමාත්‍යාංශය යටතේ, සාම්ප්‍රදායික බලි තොවිල් ශිල්පීන් ඇතුලු ශාන්තිකර්මවේදීන්ගේ ගැටළු නිරාකරණය සඳහා විශේෂිත නියාමන ඒකකයක් ස්ථාපිත කිරීම | අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ ගබඩාකර ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. |
| **සමාජ ආරක්ෂණය සහ සුභසාධනය** | | අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන් බවට පත් කිරීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම | දිවි නැඟුම වැඩසටහන නැවත ආරම්භ කිරීම හා යාවත්කාලීන කිරීම.<br><br>සමෘද්ධිලාභී පවුල් වල තරුණ තරුණියන් වෘත්තිය පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කිරීම.<br><br>සමෘද්ධි අධිකාරියෙහි අඩු ආදායම්ලාභී පවුල් වලට ලබා දෙන සියලු සහනාධාර ඉහල නැංවීමට කටයුතු කිරීම.<br><br>නවීන තාක්ෂණය භාවිතා කර සියලු සමෘද්ධි බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම.<br><br>සමෘද්ධි සංවර්ධන  දෙපාර්තමේන්තුවේ සේවයේ නියතු නිලධාරින් සම්බන්ධව පවතින වැටුප්, දීමනා, උසස් වීම් සහ විශ්‍රාම වැටුප් පිලිබඳ ගැටළු විසදීම සඳහා කටයුතු කිරීම.<br><br>දැනට විශ්‍රාම වැටුප් නොලබන ජනතාව සඳහා නව දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවීමට කටයුතු කිරීම.<br><br>මාරාන්තික රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන්නන් හට ලබාදෙන මාසික දීමනාව |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | ඉහල නැංවීමට කටයුතු කිරීම.<br><br>කිසිදු ජීවන මාර්ගයක් නොමැති, අවුරුදු 12 ට වඩා අඩු දරුවන් සිටින ඒක මාපිය පවුල් සඳහා මාසික දීමනාවක් ලබාදීමට කටයුතු කිරීම. |
| අපරාධ පාලනය | | | සියලු ආකාරයේ අපරාධ මර්දනය සඳහා අවශ්‍ය නූතන තාක්ෂණික දැනුම ලබාදී පොලිසිය ශක්තිමත් කිරීම.<br><br>සියලු අපරාධ නඩු නොපමාව නිමා කිරීම සඳහා අධිකරණ පද්ධතිය ප්‍රතිව්‍යුහගත කිරීම.<br><br>අපරාධකරුවන්ට සහය දක්වන දේශපාලනික මැදිහත්වීම් වැලැක්වීම සඳහා විශේෂිත නියාමන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.<br><br>බන්ධනාගාරය තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.<br><br>සුළු වැරදි වලට සහ පලමු වරට සිරගත වන්නන් පුනරුත්ථාපනය සඳහා අංග සම්පූර්ණ විශෝධන මධ්‍යස්ථාන දෙකක් ස්ථාපනය කිරීම.<br><br>නැවත බන්ධනාගාරගත වන පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිමත්, විශේෂ වැඩසටහනක් සකස් කිරීම. |
| මාර්ග අනතුරු පාලනය | | | සියලු මාර්ගවල, පදිකයන් වෙනුවෙන් පදික වේදිකා ඉදිකරන අතර පාර මාරු වීම නියමිත ස්ථාන වලින් පමණක් සිදු කිරීමට ක්‍රමවේදයක් ඇති කිරීම.<br><br>සියලු ප්‍රධාන මාර්ග CCTV කැමරා මඟින් සුපරීක්ෂණය කිරීම.<br><br>රිය අනතුරු මඟින් සිදුවන මරණ සහ සදාකාලික ආබාධිතභාවයට පත්වූවන් සඳහා ප්‍රමාණවත් වන්දි මුදලක් ලබාදීමට අවශ්‍ය නීති සංශෝධනය කිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **සතා සිව්පාවාටද සෙනෙහස** | | | අලින් ඇතුළු සියලු වන සීපාවන් සහ කුරුල්ලන් ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.<br><br>පසුගිය වසර පහ තුළ සහාසික ලෙස මරාදමන ලද අලි ඇතුන් පිළිබඳව නිසි පරීක්ෂණ සහ අපරාධකරුවන්ට එරෙහිව නීතිය දැඩි ලෙස බලාත්මක කිරීමට කටයුතු කිරීම.<br><br>මහ මඟ දමා යන ගෘහාශ්‍රිත සතුන් සඳහා විශේෂිත රැකවරණ මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.<br><br>සුරතල් සතුන්ට අවශ්‍ය බෙහෙත් සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා සහන මිල ක්‍රමයක් හඳුන්වාදීම.<br><br>සතා සිපාවන් කෙරෙහි කරුණාව දැක්වීම කුඩා කල සිටම පුරුදු කිරීම සඳහා “සත්ත්ව මිතුරු” ළමා සමාජ පිහිටුවීමට කටයුතු කිරීම. |

# 10 පරිච්ඡේදය

## ගම සමඟ පිළිසඳර

- අපගේ ක්‍රියාවන්ගේ ප්‍රතිඵලය ලෙස 2025 වන විට, හුදකලා ගම්මාන සියලු පහසුකම් සහිත පූර්ණ ඒකාබද්ධ ආර්ථික මධ්‍යස්ථාන බවට පත්වනු ඇත.
- අපගේ ඉලක්කය වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල සියලු පුරවැසියන්ට බියෙන් හා සැකයකින් තොරව ජීවත් විය හැකි ආකාරයේ වටපිටාවක් බිහි කිරීමයි.
- ප්‍රධාන වශයෙන් තේ කර්මාන්තයේ නියලෙන වතු ජනගහනයට සමාන අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති අයිතිය අප විසින් පිළිගනු ලැබේ.

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| **ග්‍රාමීය සංවර්ධනය** | සියලුම ගම්මානවල අත්‍යවශ්‍ය සියලුම පහසුකම් වලින් සමන්විත වන බව සහතික කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් දියත් කිරීම | ජනමූල මණ්ඩල - ජනමූල මධ්‍යස්ථාන පිහිටුවීම | • පහත දැක්වෙන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා සෑම ගමකම ආගමික නායකයින්, උගත් හා දැනුමැති ජ්‍යෝෂ්ඨයින්, තරුණ නායකයින් සහ කාන්තා නියෝජිතයින් සමන්විත සෑම ග්‍රාමසේවා කොට්ඨාසයකම ජනමූල මණ්ඩලයක් පිහිටුවීම;<br>- විදුලිය, පිරිසිදු පානීය ජලය, ප්‍රවේශ මාර්ග, වාරි ජල පහසුකම්, පෙර පාසල්, මාතෘ හා ළමා සායන, ප්‍රජා ශාලාව, ක්‍රීඩා පිටිය සහ අපද්‍රව්‍ය කළමනාකරණය ආදියෙහි ක්‍රියාකාරිත්වය ගැන සැලකිලිමත් වීම.<br>- කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ සුලු කර්මාන්ත ආදිය සඳහා අවශ්‍ය තාක්ෂණය, පර්යේෂණ සහ උපකාරක සේවා සැපයීම පිළිබඳ අධීක්ෂණය හා පසු විපරම් කිරීම.<br>• සෑම ග්‍රාමසේවා කොට්ඨාසයකම එක් ජනමූල මධ්‍යස්ථානයක් පිහිටුවීම<br>- ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන නිලධාරී සහ පවුල් සෞඛ්‍ය නිලධාරීන් සඳහා කාර්යාල ලෙස භාවිත කිරීම.<br>- තරුණයින් සඳහා අන්තර්ජාල පහසුකම්, විද්‍යුත් පුස්තකාලය, ළමා මධ්‍යස්ථානය, ස්මාර්ට් ඉගැන්වීම් කාමරය සහ තාක්ෂණික සේවා මධ්‍යස්ථානය වැනි සේවාවන් සැපයීම |
| **කාන්තා සවිබල ගැන්වීම** | කාන්තාවන් නඟා සිටුවීම හා ඔවුන් ගොවි ව්‍යවසායකයින් බවට පත් කිරීම සහ ග්‍රාමීය කාන්තාවන්ගේ | කාන්තාවන්ගේ මිල කළ නොහැකි උත්සාහයන් හඳුනාගෙන ආර්ථික කටයුතුවලදී ග්‍රාමීය කාන්තාවන්ගේ දායකත්වය වැඩි දියුණු | • හඳුනාගත් ඉලක්ක වෙළඳපල සඳහා එනම්, අත්යන්ත්‍ර රෙදි, ඇඟලුම්, බීරලු, රේන්ද්‍ර, උක්, මැටි, කොහු, කරවල හා ධීවර කර්මාන්තයට සම්බන්ධ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා කාන්තා ව්‍යවසායකයින්ට සම්බන්ධ විය හැකි ආකාරයට රාජ්‍ය අනුග්‍රහය දක්වන යාන්ත්‍රණයක් සැකසීම.<br>• රැකියා විරහිත ගෘහස්ථ සාමාජිකයින්, විශේෂයෙන් ගෘහණියන්ට ස්වභාවිකවම ලබා ගත හැකි අතිරික්ත පලතුරු සහ එළවළු තමන්ගේම ගෙවතු වල අගය එකතු කළ නිෂ්පාදනයන් |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | ආර්ථික කටයුතුවල නියැලීම වැඩි දියුණු කිරීම | කිරීම. | බවට පත්කිරීමට දිරිමත් කිරීම.<br>• එම අගය එකතු කිරීමේ නිෂ්පාදන හෝ අමුද්‍රව්‍ය අගය එකතු කිරීමේ නිෂ්පාදන මධ්‍යස්ථාන සඳහා සැපයීම.<br>• ඔවුන්ගේ නිවෙස්වලින් මෙම නිෂ්පාදන එකතු කිරීම සඳහා වෙනම ක්‍රමවේදයක් නිර්මාණය කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීමේ සන්නිවේදන මෘදුකාංගයක් (Mobile App) හඳුන්වා දීම.<br>• නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවලින් පීඩනයට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහනයක් ලබාදීම. |
| ප්‍රාදේශීය සංවර්ධනය | ග්‍රාමීය සංවර්ධනය ප්‍රාදේශීය සංවර්ධනය සමඟ සම්බන්ධ කිරීම | නගර මෙගා ප්‍රදේශ(metropolitan area) ලෙසත් ගම් කලාපීය ප්‍රදේශ ලෙසත් සංවර්ධනය කිරීම | • භූගෝලීය, ජනගහනය සහ පරිපාලන අංශ මත පදනම්ව නව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ සීමාවන් නැවත තක්සේරු කිරීම හා වෙන් කිරීම සඳහා පූර්ණ බලතල සහිත කමිටුවක් පත් කිරීම.<br>• ප්‍රාදේශීය සංවර්ධන සැලැස්ම තුළ ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභාවලට අදාළ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා පළාත් පාලන ආයතනවලට අමතර බලතල ලබා දීම.<br>• වෙන් කරන ලද අරමුදල් ගම් හා ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට ප්‍රමාදයකින් තොරව පළාත් සභාවලට සෘජුවම ලබා දෙන ලෙස අදාළ අමාත්‍යාංශවලට උපදෙස් දීම.<br>• ග්‍රාම සේවා කොට්ඨාසවල සංවර්ධන ව්‍යාපෘති ජනමූල මණ්ඩලයේ සහයෝගය ඇතිව පළාත් පාලන ආයතන විසින් නියමිත කාල සීමාව තුළ කාර්යක්ෂමව හා විනිවිදභාවයෙන් යුතුව සම්පූර්ණ කිරීම. |
| ප්‍රාදේශීය සංවර්ධනය – උතුරු සහ නැගෙනහිර පළාත් | බියෙන් සැකෙන් තොරව සුව පහසුවෙන් ජීවත් විය හැකි සමෘද්ධිමත් ප්‍රදේශයක් ලෙස උතුරු සහ නැගෙනහිර පළාත් නඟා සිටු වීම | ආර්ථික සංවර්ධනය අතින් උතුරු සහ නැගෙනහිර පළාත් ඉහළට ම ඔසවා තැබීම | • උතුරු සහ නැගෙනහිර පළාත්වල ජනතාවගේ ජීවනෝපාය මාර්ග සහ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සවිබල ගැන්වීමට පුනර්ජීවන අරමුදල" ආරම්භ කිරීම සහ එමඟින් පහත සඳහන් පහසුකම් ලබාදීම;<br>– යුද්ධයෙන් පීඩාවට පත් උතුරු හා නැගෙනහිර පවුල් සඳහා නිවාස ලබාදීම.<br>– ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය නිසා පීඩාවට පත්ව සිටින උතුරු හා නැගෙනහිර පවුල්වල කාන්තාවන් සඳහා රජයේ මැදිහත් වීමෙන් විවිධ ව්‍යවසායන් සඳහා සහන ණය සහ කෘෂිකාර්මික ණය ලබාදීම.<br>– පුනරුත්ථාපනය කරනු ලැබූ තරුණ තරුණියන් ව්‍යවසායකයන් බවට පත් කිරීමට අවශ්‍ය ආයෝජන ලබාදීම.<br>– තරුණ තරුණියන්ට රැකියා ලබාදීම සඳහා අප විසින් ආරම්භ කරන ආර්ථික සංවර්ධන |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | කලාපවල හෝ වෙනත් ස්ථානවල මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ප්‍රාග්ධන ආයෝජන ලබාදීම.<br>– තරුණ තරුණියන්ට අවශ්‍ය වෘත්තීය පුහුණු හෝ වෘත්තීයවේදී අධ්‍යාපනය ලැබීම සඳහා රැකියාවක නිරත වෙමින් ගෙවිය හැකි ආකාරයට ණය මුදල් ලබාදීම.<br>• රජය විසින් අත්පත් කරගෙන ඇති පෞද්ගලික ඉඩම් ඒවායේ අයිතිකරුවන්ට ලබාදීම සහ රජයේ ඉඩම් මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කෘෂි වගාවන් සඳහා බදු පදනම යටතේ ලබාදීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා ඉඩම් බලපත්‍ර ලබා දීම.<br>• රජයේ රැකියාවල පුරප්පාඩු පිරවීමේදී හැකිතාක් එම පළාත්වල තරුණ තරුණියන්ට ප්‍රමුඛත්වය ලබා දෙන අතරම මෙම පළාත්වල සේවය කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගැනීමේදී දෙමළ භාෂා දැනුම සලකා බැලීම<br>• දේශීය ව්‍යවසායකයින් කෘෂිකාර්මික නිෂ්පාදනවලට අගය එකතු කිරීමට මෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ආර්ථික කලාප පිහිටුවීම<br>• විශ්වවිද්‍යාල, විද්‍යායතන, වෘත්තීයවේදී අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික විද්‍යායතන, තොරතුරු තාක්ෂණික සහ කෘෂි පර්යේෂණ ආයතන ආදිය ආරම්භ කර එමඟින් තරුණ තරුණියන්ගේ අනාගත අභිලාෂයන් සපුරාලීම.<br>• නර්තන, නාට්‍ය සහ ප්‍රසංග පැවැත්වීම, එම අංශවල පුහුණුවීම් සහ ඉගැන්වීම් සඳහා නවීන පහසුකම්වලින් යුත් "නෙළුම් පොකුණක්" යාපනයේ ඉදි කිරීම.<br>• ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගනයක් සහ උසස් මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩා පිටියක් ලබාදීම. |
| **ප්‍රාදේශීය සංවර්ධනය – වතු අංශය** | වතු අංශය සමෘද්ධිමත් කිරීම | වතු ප්‍රජාව සඳහා සංවර්ධිත ආර්ථිකයක්, උසස් තත්ත්වයේ නිවාස, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සහිත සුව පහසු ජීවන තත්ත්වයක් ස්ථාපිත කිරීම | • වතු කම්කරු දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කිරීම<br>• වතුවල දැනට භාවිතයට නොගන්නා ඉඩම්වල දේශීය සහ විදේශීය ඉල්ලුමක් ඇති මල් වර්ග, කාබනික වගාවන් ඇති කිරීම සහ දේශගුණයට ගැළපෙන අතිරේක භෝග වගාවන් ව්‍යාප්ත කිරීම<br>• උසස් පෙළ විද්‍යා සහ වාණිජ විෂය ධාරාව ඉගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් උසස් පෙළ උගන්වන සෑම පාසලකටම ලබා දීම සහ පසුගිය කාලය තුළ අවිධිමත් ලෙස බඳවාගෙන ඇති ගුරු සහායකවරුන්ගේ ගැටලුව සඳහා ස්ථිර විසඳුමක් ලබා දීම.<br>• වතු ආශ්‍රිත අඩු මහල් ප්‍රමාණයකින් යුත් නිවාස යෝජනා ක්‍රමයක් වතු හිමියන්ගේ ද දායකත්වය සහිත ව හඳුන්වා දීම සහ මෙම නිවාස යෝජනා ක්‍රමය තුළ අංග සම්පූර්ණ සෞඛ්‍ය මධ්‍යස්ථාන, පෙර පාසල් සහ ප්‍රජා ශාලා ඇතුළු පහසුකම් ද ස්ථාපිත කිරීම. |

| අංශය | ප්‍රතිපත්තිය | උපාය මාර්ග | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| | | | • ගර්භිණී මව්වරුන්ගේ සහ ළදරුවන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීම සඳහා 'නව පෝෂණ ආධාර වැඩසටහනක්' ක්‍රියාත්මක කිරීම සහ වතු රෝහල්වලට අවශ්‍ය සියලුම භෞතික සහ මානව සම්පත් ලබා දීම.<br>• කෘෂිකාර්මික පර්යේෂණ ඥානය සහ නූතන තාක්ෂණික භාවිතයන් තරුණ තරුණියන්ට ලබාදීම සඳහා කෘෂිකාර්මික විද්‍යාලයක් ආරම්භ කිරීම.<br>• අංග සම්පූර්ණ දෙමළ මාධ්‍ය ගුරු විද්‍යාලයක් ස්ථාපනය කිරීම සහ වෘත්තීයවේදී අධ්‍යාපනය ලබාදීම සඳහා විවෘත විශ්වවිද්‍යාල ශාඛාවක් හැටන් හි ස්ථාපනය කිරීම.<br>• දැනට වසා දමා ඇති කර්මාන්ත ශාලා නැවත ආරම්භ කිරීමට ඇති හැකියාව සොයා බැලීම සහ වතු ක්ෂේත්‍රය ආවරණය වන පරිදි නව කර්මාන්ත කලාපයක් ආරම්භ කිරීම<br>• රජයට අයත් වතු වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නැවත වගාකිරීමට සහ පොහොර යෙදවුම්වලට අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දී නිසි කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීම<br>• ඉපැරණි වතු බංගලා සහ අත්හැර දමන ලද තේ කර්මාන්තශාලා ආකර්ෂණීය සංචාරක බංගලා බවට පත් කිරීම. |